# මෙත් සවිය

## මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදය

METH SAVIYA NEWS LETTER

❖ සාමාජිකයින් සඳහා තොරතුරු පත්‍රිකාව ❖ 2009 අගෝස්තු ❖ මෙත් සවිය අටවන කාණ්ඩය ❖ දහතුන්වන කලාපය






රාජගිරිය කලපළුවාව තපෝවනයේදී



සම්මාන ලාබින් සමග මහ සමුළුව ඇරඹුමොහොත



ප්‍රතිසංස්කරණ කටයුතු නිමාකළ ශ්‍රී විජයාරාමය ධර්ම ශාලාව



ආනුරාධපුර ශ්‍රී මහා බෝධින් වහන්සේට කිරි ආහාර පිළිගැන්වීම

නිතින් මෙත් සිතින් මම් වෙසෙම් වා
ගතින් මෙත් සිතින් රෝ මුදම් වා
බැතින් තුන් රුවන් ඔප් නගම් වා
මෙතින් නෙත් පියම් වා නිවෙම් වා


ශ්‍රී විජයාරාමය, ෆෙඩ්‍රිකා පාර, කොළඹ - 06

දු.ක: 0714 014467 දුක/ෆැක්ස්: 011 2505088 වෙබ් අඩවිය: www.methsaviya.org විද්‍යුත් තැපෑල: office@methsaviya.org

# මෙත්සවිය ආවර්ජනා






01.03.2009 දින බොරැල්ල Y.M.B.A. හි පැවති සාර්ථකව ඉගෙනගන්නා අන්දම හා විභාග සමත් වන අන්දම පිළිබඳව වූ වැඩමුළුව




වැඩමුළුවට සාහබාගිවූ මෙත්සවිය කමිටු නිලමඬුල්ලෙන් කොටසක්.





ගුණ පහ පුහුණු කිරීම

මෙත්සවිය භාවනා වැඩසටහනේ අවස්ථාවන්



මහසමුළුව ද ධර්ම දේශනාව පැවැත්වූ පූජ්‍යපාද අගලකඩ සිරිසුමණ හිමිපාණෝ



ඉපැරණි සිංහල බෞද්ධ ක්‍රමයට රොග සුව කිරීම පිලිබඳ දේශනය වෛද්‍ය ටී.අඹිතලාව මයා




මාසික ධර්ම දේශනය පැවැත්වූ මාවරලේ භද්දිය ස්වාමින්වහන්සේ





ගව ඝාතකාගාරයෙන් නිදහස්කරගත් ගැබ්බර එළදෙනකු වැල්ලවත්ත ශ්‍රී විජයාරාමයේදී පැටවකු ප්‍රසූත කළ අවස්ථාව.

# මෙත් සවිය

## මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදය

ශ්‍රී විජයාරාමය, ෆෙඩ්‍රිකා පාර, කොළඹ - 06
දු.ක: 0714 014467 දුක/ෆැක්ස්: 011 2505088 වෙබ් අඩවිය: www.methsaviya.org විද්‍යුත් තැපෑල: office@methsaviya.org

### අප ගැන වචනයක්...

මෙත් සවිය සංසදය නිරවුල් මනසක් ඇති වර්ධනය කරගත් මානසික ශක්තියක් සහිත බුද්ධිමත් ශ්‍රී ලංකික ජනතාවක් බිහි කිරීමේ අරමුණින් අරඹන ලද සාමාජිකයන්ගේ එකතුවකි. ඒ ඒ ක්ෂේත්‍රයන්ට අදළ විශේෂඥයින් හා උගතුන් ගෙන්වා සාමාජිකයන් දැනුවත් කරනු වස් විවිධ වැඩසටහන් මෙමගින් පැවැත්වීමට බලාපොරොත්තු වනු ලැබේ. වැඩසටහන් සඳහා මාතෘකා තෝරා ගැනීමද සාමාජිකයන්ගේ කැමැත්ත/ඉල්ලීම මත සිදුකරනු ලැබේ. සංසදය විසින් පවත්වනු ලබන සාර්ථකව ඉගෙන ගන්නා අන්දම හා විභාග සමත් වන අන්දම, කාල කළමණාකරණය, නායකත්වය ත්‍රෛමාසික චිත්ත සංයම අභ්‍යාස හා භාවනා වැඩසටහන් වැනි ඒ ඒ කාල වලදී පවත්වන වැඩසටහන් සඳහා සහභාගී වීමේ වරප්‍රසාදය සියලු සාමාජිකයන්ට හිමිවේ. මීට අමතරව සාමාජිකයන්ගේ දැනුම හා ශික්ෂණය වර්ධනය කිරීම සඳහා සෑම මාස තුනකටම වරක් දන-සීල-භාවනා වැඩසටහන්ද පවත්වනු ලැබේ. සංසදයේ ප්‍රධාන නිලතල දරණ විධායක කමිටු හා ක්‍රියාකාරී කමිටු සාමාජිකයන් මාංශ භක්ෂණයෙන් හා රහමෙර පානයෙන් තොර දිවි පැවැත්මක් ඇති අය වීම මෛත්‍රී පෙරදැරිව කටයුතු කරන මෙම සංසදයේ විශේෂත්වයකි.

### සාමාජිකයින් සඳහා වැදගත් තොරතුරු සහ ඉදිරි වැඩසටහන් පිළිබඳ විස්තර

#### 2009-08-02 ඉරුදින මාසික රැස්වීම

සෑම මසකම පළමුවෙනි ඉරුදින සිරිත් පරිදි අනිවාර්යයෙන්ම (දන-සීල-භාවනා වැඩසටහන් සඳහා සදහම් චාරිකාවේ නොයෙදෙන දින වලදී) මාසික රැස්වීම් සහ විශේෂ දේශනය කොළඹ 07, බෞද්ධාලෝක මාවතේ පිහිටි ධම්ම ගවෙශි බෞද්ධ ආශ්‍රමයේ දී පැවැත්වේ. එහෙයින් දැන්වීමක් ලැබුනද නොලැබුනද සෑම මසකම පළමුවන ඉරුදින (සදහම් චාරිකාවල යෙදෙන දින වලදී හැර) ඉහත මාසික රැස්වීම් වැඩසටහන් සඳහා ප.ව. 2.00 -4.00 අතර කාලය තුල පැමිණෙන ලෙස සියලු සාමාජිකයින්ගෙන් මෙත්සිත් පොරදැරිව ඉල්ලා සිටිමු. ඉදිරි වැඩසටහන් පිළිබඳ තොරතුරු (www.methsaviya.org) වෙබ් අඩවියෙන්ද ලබා ගත හැක.

අපගේ මීළඟ ප්‍රථම ඉරුදින මාසික වැඩසටහන 2009-08-02 දින ආරණ්‍යය වාසි අග්‍රගන්‍ය භාවනා කම්මට්ඨානාචාර්ය වරයෙකුවන පූජ්‍යපාද පිටිගල ගුණරත්න ස්වාමීන් වහන්සේ විසින් පවත්වන භාවනා සහ ධර්ම දේශනා වැඩ සටහනකින් සමන්විත වේ. කරුණාකර ප.ව. 2.00 ට පෙර පැමිණ අසුන්ගන්න.

#### 2009-09-06 ඉරුදින මාසික රැස්වීම

ප.ව. 2.00 සිට 4.00 දක්වා පැවැත්වෙන මෙම වැඩසටහන ඉහත වැඩසටහනේ දෙවන කොටස ලෙස ආරණ්‍යය වාසි අග්‍රගන්‍ය භාවනා කම්මට්ඨානාචාර්ය වරයෙකුවන පූජ්‍යපාද පිටිගල ගුණරත්න ස්වාමීන් වහන්සේ විසින් පවත්වන භාවනා සහ ධර්ම දේශනා වැඩ සටහනකින් සමන්විත වේ. කරුණාකර ප.ව. 2.00 ට පෙර පැමිණ අසුන්ගන්න.

#### 2009.09.19-20 අනුරාධපුර සඳහම් චාරිකාව

මෙත්සවිය මගින් මිරිසවැටිය සලපතල මළුවේ සිදුකරන ප්‍රතිසංස්කරණ කටයුතුවල ප්‍රගති සමාලෝචනය, රුවන්වැලි මහා චෛත්‍ය රාජයාණන් වහන්සේට කප්රුක් පූජාව කිරීම, චෛත්‍ය මළුවේ සමූහ භාවනාව, ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේට කිරිපිඬු පූජාව, අභයගිරි චෛත්‍ය රාජයාණන් වහන්සේගේ අළුත් වැඩියාවට අවශ්‍ය දෑ සැපයීම, තන්තිරිමලේ රජමහා විහාරය වැඳ පුද ගැනීම සඳහා වන සඳහම් චාරිකාව ඉහත දින වලදී සිදුකිරීමට සැළසුම් කර ඇත. විස්තර සඳහා 4 වන පිටුව බලන්න

#### සාමාජිකත්වය අළුත් කිරීම

සාමාජික පත්‍රයේ සඳහන් සාමාජිකත්වය වලංගු සීමාවේ දිනයට පෙර සාමාජිකත්වය අළුත් කර ගැනීමෙන් මෙත් සවිය සවිමත් කර ඉදිරි පුණ්‍ය කටයුතු කරගෙන යෑමට දයක වන ලෙස මෙත් සිත් පෙරදැරිව මතක් කරමු. ඒ සඳහා කාර්යාලයට පැමිණීම අත්‍යාවශ්‍ය නොවන අතර, ඒ වෙනුවෙන් ගෙවිය යුතු රු.500/= ක වාර්ෂික සාමාජික ගාස්තුව මෙත් සවිය නමින් ලියන ලද රේඛණය කල චෙක්පතක් හෝ ගෙවන කාර්යාලය, වැල්ලවත්ත ලෙස සටහන් කල මෙත්සවිය නමට එවන සාමාන්‍ය මුදල් ඇණවුමක් තම ලිපිනය ලියූ රු.30/=ක මුද්දර කවරයක් හා පැරණි සාමාජික පත්‍රයද සමග ලියාපදිංචි තැපෑලෙන් ලේකම්, මෙත්සවිය, ශ්‍රී විජයාරාමය, ෆෙඩ්රිකා පාර, කොළඹ 06 වෙත එවීමෙන් අලුත් සාමාජික පත්‍රය ලියාපදිංචි තැපෑලෙන් ලබා ගත හැකි බවද කාරුණිකව දන්වමු.

#### 17 වන චිත්ත සංයම අභ්‍යාස හා භාවනා වැඩසටහන 2009 සැප්තැම්බර් මස 27 ඉරු දින ප.ව 2.00 ට ශ්‍රී විජයාරාමයේදී ආරම්භ කෙරේ.

ඒ සඳහා අයදුම්පත් 2009 අගෝස්තු 23 තෙක් භාර ගැනේ.

### මෙත් සවිය - විධායක කමිටුව 2009

**ගරු අනුශාසකවරු**
ශ්‍රී විනයාචාර්ය ශ්‍රී ධර්ම රක්ෂිත වංසාලංකාර අතිපූජ්‍ය අහංගම ආනන්ද මහා සථිවිරයන් වහන්සේ

අතිපූජ්‍ය
මඩවල උපාලි මහා සථිවිරයන් වහන්සේ

**ගරු සභාපති**
විද්‍යා කීර්ති, ශාසනදීපන, ලෝකාර්ථචාරී, විද්‍යාවාචස්පති දේශමාන්‍ය,විශ්ව විද්‍යා අධිමානසික විද්‍යාවේදී,නාලන්දා කීර්ති ශ්‍රී ආචාර්ය චන්දන ජයරත්න මහතා

**ගරු උප සභාපතිවරු**
ඉංජිනේරු සරත් ඉලංගන්තිලක මහතා
නිහාල් මෙන්ඩිස් මහතා

**ගරු සම ලේකම්වරු**
තුසිත දොඹගොඩ මහතා
චමින්ද බලවෙදගේ මහතා

**ගරු භාණ්ඩාගාරික**
වාසනා රණසිංහ මහතා

**ගරු උප භාණ්ඩාගාරික**
ජනක සුවඳරත්න මහතා

**සංස්කාරක**
සෙනරත් බණ්ඩාර බුළුමුල්ල මහතා

**පරිගණක සංස්කාරක සහ වෙබ් අඩවි කළමණාකරු**
චමිල ප්‍රසන්න මහතා


**ගරු කාරක සභිකවරු**

නාලක එදිරිසිංහ මහතා
පී. සූරියආරච්චි මහතා
සුසන්ත යාපා මහතා
රංජිත් සොයිසා මහතා
එස්.කේ.කළුබෝවිල මහතා
බංදු අබේරත්න මහතා

**මෙත්සවිය මගින් මිරිසවැටිය සලපතල මළුවේ සිදුකර ප්‍රතිසංස්කරණ කටයුතුවල ප්‍රගති සමාලෝචනය, රුවන්වැලි මහා චෛත්‍ය රාජයාණන් වහන්සේට කප්රුක් පූජාව කිරීම, චෛත්‍ය මළුවේ සමූහ භාවනාව, ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේට කිරිපිඬු පූජාව, අභයගිරි චෛත්‍ය රාජයාණන් වහන්සේගේ අළුත් වැඩියාවට අවශ්‍ය දෑ සැපයීම, තන්තිරිමලේ රජමහා විහාරය වැඳ පුද ගැනීමේ සඳහම් චාරිකාව.**



රුවන්වැලි මහා චෛත්‍ය රාජයාණන් වහන්සේ



අභයගිරි චෛත්‍ය රාජයාණන් වහන්සේ



ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ



තන්තිරිමලේ රජමහා විහාරය

ඉහත අනුරාධපුර හා තන්තිරිමලේ රජමහා විහාර චාරිකාව 2009 සැප්තැම්බර් මස 19 හා 20 දිනවලදී සිදුකිරීමට අවශ්‍ය කටයුතු සකස් කොට ඇත. (සැප්.19 දින පෙ.ව.7.00 ට වැල්ලවත්ත ශ්‍රී විජයාරාමයෙන් පිටත් වී සැප්තැම්බර් 20 දින ප.ව.6.00 නැවත වැල්ලවත්ත ශ්‍රී විජයාරාමට පැමිණීමට අපේක්ෂා කෙරේ) වැඩසටහන් විස්තරය පහත දක්වා ඇත.

සංසදයේ සමාජික සාමාජිකාවන්ට හා ඔවුන්ගේ පවුල් වල ඥාතීන්ට පමණක් මෙම සඳහම් චාරිකාවට සහභාගී විය හැකි බව කාරුණිකව දන්වා සිටිමු. අනුරාධපුරයේ නවාතැන් ගැනීම සඳහා රත්නමාලී විශ්‍රාම ශාලාව වෙන්කොට ඇති අතර ප්‍රවාහන කටයුතු සඳහා වායු සමනය කරන ලද සුඛෝපබෝගී බස් රථ යොදවනු ලැබේ.

**කප් රුක් පූජාව හා කිරිපිඬු දනය**

රුවන්වැලි මහා චෛත්‍යරාජයාණන් වහන්සේට කප්රුක් පූජාව සඳහා සිවුරු රෙදි මීටර් 300 ක් පමණ අවශ්‍ය වේ. කිරිපිඬු දනය සඳහා අවශ්‍ය කලමනාවලට හා කප්රුක් පූජාවේ සිවුරු මීටරයක් වෙනුවෙන් රු.160/- පමණ වැය වේ. මේ සඳහා පින්වත් ඔබට සිවුරු මීටරයකට හෝ මීටර් කිහිපයකට දායක විය හැක. <u>මෙම කප්රුක් පූජාව සිතූ පැතූ සම්පත් දෙන පුණ්‍යකර්මයක් වනවාසේම, මෙම වස්සාන කාලය තුළ තථාගත බුදුපියාණන්ට බඳපටියක් පූජා කිරීමෙන් ලැබෙන අනුසස් ද ඇතිවන මහා පුණ්‍යකර්මයකි</u>. (සඳහම් චාරිකාවට සහභාගී නොවන සාමාජිකයින්ට ද කප්රුක් පූජාව සඳහා ආධාර කල හැක.)

**අභයගිරි චෛත්‍ය රාජයාණන්ගේ අළුත්වැඩියා කටයුතු**

අභයගිරි චෛත්‍ය රාජයාණන්ගේ අළුත්වැඩියා කටයුතු සඳහා අවශ්‍යව ඇති පහත සඳහන් ද්‍රව්‍ය අනුරාධපුර ගෙනයාමට කාර්යාලයට භාර දිය හැක. හුඹස් මැටි ප්‍රවාහනය සඳහා වෙනම ලොරි රථයක් යොදවා ඇත.

| | | |
|---|---|---|
| 1.හුඹස් මැටි | 2.අළුහුණු | 3.හිස් උර (හාල් / පෝර උර) |
| 4.මේසන් හැඳි | 5.උදලු | |

**ප්‍රවාහන ගාස්තු**

මෙම චාරිකාව සඳහා වායුසමනය කල සුඛෝපභෝගී බස් රථ වලින් අනුරාධපුර හා තන්තිරිමලයටය යාම් ඊම් වෙනුවෙන් එක් අයෙකුට ප්‍රවාහන බරපැන රු.1400/- ක් වේ.

**නවාතැන් පහසුකම්**

සැප්තැම්බර් 19 දින දහවල සිට 20 දින දහවල දක්වා රත්නමාලී විශ්‍රාම ශාලාව ඔබගේ නවාතැන් පහසුකම් සඳහා වෙන් කර ඇත. මෙහි පහත සඳහන් ලැයිස්තුවේ විශ්‍රාම ශාලාවේ කාමර සඳහා වූ ගෙවීම් පිළිබඳ විස්තර සපයා ඇත.

**බස් රථ ආසන, විශ්‍රාම ශාලාවේ කාමර වෙන් කිරීම හා ආහාර සඳහා මුදල් ගෙවීම.**

2009 සැප්තැම්බර් 05 දිනට පෙර බස්රථ ආසන වෙන් කිරීම, කාමර වෙන් කිරීම හා ආහාර සඳහා මුදල් ගෙවීම මෙත් සවිය කාර්යාලයට පැමිණ සිදු කලයුතු බව කාරුණිකව මතක් කරමු. (පැමිණීමට පෙර කාර්යාල ජංගම දුරකථන අංක 0714014467 අමතා කාර්යාලය විවෘතව පවතින වේලාවන් දැනගත හැක.)

**ආහාර පාන**

ගමන පිටත්වන සැප්තැම්බර් 19 දින උදේ ආහාරය සපයනු නොලැබේ. සැප්තැම්බර් 19 වන දින දහවල සිට සැප්තැම්බර් 20 දහවල දක්වා ආහාර සපයනු ලැබේ. ඒ සඳහා උදේ කෑම වේලක් වෙනුවෙන් රු.65/- ක්ද, රාත්‍රී හා දහවල් කෑම වේලක් වෙනුවෙන් රු.90 ක්ද ගෙවිය යුතුය. සැප්තැම්බර් 19 වන දින රාත්‍රියේ සිට සැප්තැම්බර් 20 වන දින දහවල් දක්වා ආහාරපාන රත්නමාලී විශ්‍රාම ශාලාවේ ආපන ශාලාවෙන් ලබා දෙනු ඇත. උදේ සවස තේ පැන්ද ආපන ශාලාවෙන් මිලදී ගත හැක. (පිඟානක් කෝප්පයක් රැගෙන එන්න.)

## <u>වැඩසටහන් විස්තරය</u>

**2009.09.19**

පෙ.ව.07.00 ❖ ශ්‍රී විජයාරාමයෙන් අනුරාධපුරය බලා පිටත් වීම.
පෙ.ව.11.00 ❖ අවුකන පිළිම වහන්සේ හා විජිතපුර නැරඹීම.
❖ කලාවැව වැව්තාවුල්ලෙදී දිවා ආහාරය සැපයීම.
❖ අනුරාධපුර රත්නමාලී විශ්‍රාම ශාලාව වෙත ළඟා වීම.
❖ අභයගිරි චෛත්‍ය රාජයාණන්ගේ අළුත්වැඩියා කටයුතු සඳහා හුඹස් මැටි හා අනෙකුත් ද්‍රව්‍ය පූජා කිරීම.
❖ තෝරාගත් විශේෂ ස්ථාන නැරඹීම. (ගයිඩ් මහතකුගේ මග පෙන්වීම සහිතව)
ප.ව.05.00 ❖ රත්නමාලී චෛත්‍ය රාජයාණන් වහන්සේට කප්රුක් පූජාව කිරීම.
❖ අනුශාසනා
❖ භාවනා වැඩසහන චෛත්‍ය මළුවේදී
❖ අෂ්ඨපාන පූජාව
ප.ව.08.30 ❖ රත්නමාලී විශ්‍රාම ශාලාව - රාත්‍රී ආහාරය.

**2009.09.20**

පෙ.ව.04.00 ❖ කිරිපිඬු පූජාව පිළියෙල කිරීම.
පෙ.ව.05.30 ❖ කිරිපිඬු පූජා පෙරහැර.
පෙ.ව.06.00 ❖ කිරිපිඬු පූජාව පෙරහැර ජය ශ්‍රී මහා බෝධියට ළඟා වීම හා පූජා කිරීම.
පෙ.ව.08.00 ❖ රත්නමාලී විශ්‍රාම ශාලාව උදේ ආහාරය
පෙ.ව.09.00 ❖ තන්තිරිමලේ බලා පිටත් වීම
පෙ.ව.10.00 ❖ තන්තිරිමලේට පැමිණීම හා වැඳ පුද ගැනීම.
ප.ව.12.00 ❖ දිවා ආහාරය තන්තිරිමලේ දී
ප.ව.12.30 ❖ තන්තිරිමලයෙන් පිටත් වීම.
ප.ව.01.30 ❖ අනුරාධපුරයෙන් කොළඹ බලා පිටත් වීම.
ප.ව.06.00 ❖ කොළඹට ළඟා වීම.

මෙම සඳහම් චාරිකාවේ සියළු පූජා කටයුතු, නවාතැන්, ආහාර පාන, ප්‍රවාහන පහසුකම් ගැන වැඩි විස්තර අප සංසදයේ පහත සඳහන් නිළධාරී මහතුන්ගේ ජංගම දුරකථන වලට ප.ව.7.00 න් පසු ඇමතීමෙන් ලබා ගත හැකි බව කාරුණිකව මතක් කරමු.

<u>පූජා කටයුතු පිළිබඳ විමසීම්</u> - ගරු විධායක ලේකම් තුසිත දෙඹගොඩ මහතා - දු.ක. 0714454411
<u>ප්‍රවාහන කටයුතු පිළිබඳ විමසීම්</u> - ගරු සම ලේකම් - චමින්ද බලවෙදගේ මහතා - දු.ක. 0777790076
<u>ආහාර පාන හා වෙනත් පහසුකම්</u> - ගරු උප සභාපති - සරත් ඉලන්ගන්තිලක මහතා - දු.ක.0714340107 හෝ ගරු භාණ්ඩාගාරික - ඩබ්.ඩබ්.රණසිංහ මහතා - දු.ක. 07144297707
<u>අභයගිරි ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳ විමසීම්</u> - ගරු උප සභාපති - නිහාල් මෙන්ඩිස් මහතා - දු.ක. 0718266143

/නවතැන් විස්තර සඳහා 9 වන පිටුවට බලන්න...

# අපගේ ආශිර්වාද හා පුණ්‍යානුමෝදනාව

## වැල්ලවත්ත ශ්‍රී විජයාරාමය ධර්මශාලාව ප්‍රතිසාංස්කරණය කිරීම සඳහා ආධාර කළ පිංවතුන්.



**රු.100,000 ක් ආධාර කල පිංවතුන්**
ජේ.මල්ලිකාරච්චි මයා, ටී.එල්.මල්ලිකාරච්චි මයා

**රු.25,000 ක් ආධාර කල පිංවතුන්**
ආචාර්ය චන්දන ජයරත්න මයා, උදය කුමාර පීරිස් මයා

**රු.22,000 ක් ආධාර කල පිංවතුන්**
ඊ.පී.විජේරත්න මිය

**රු.11,000 ක් ආධාර කල පිංවතුන්**
අසේලා කුලුප්පුආරච්චි මිය

**රු.10,000 - 6000 ත් අතර**
එච්.එම්.බන්දුලසේන මයා, විනීතා උළුවත්ත මිය, තුෂාරී සඳමාලි ගෝමස් මිය, සමන්ති අනුබුදු මිය, ඒ.ටී.ෆොන්සේකා, 13 වැනි අධිමානසික විද්‍යා පංතිය සාමාජිකයින්.

**රු.5,500 - 5000 ත් අතර**
එල්.ටී.දෙඹගොඩ මයා, ඒ.පී.ප්‍රේමතිලක මෙය, සී.ඒ. මද්දුගොඩ මෙය, ජේ.එස්. ගුණියන්ගොඩ මෙය, ආචාර්ය එස්.අයි.ඒ. ජයතිලක මිය, කේ.පී.පී. ඉරන්ගනී මිය, එස්.ආර්. ගුරුසිංහ මයා, එල්.ඒ.ජේ. රණවීර මිය, ලසන්ත පෙරේරා මයා, එස්.ඒ. වික්‍රමසූරිය මයා, එච්.එස්.එන්.වික්‍රමසූරිය මයා, ඩබ්.යූ.විමලධර්ම මයා, ලොරානි සිරිමාන්න මිය, භාග්‍යා කුලතුංග මිය, ජයවි ගුණසේකර මයා, බී.හේමපාල මයා, එච්.ඒ.ඩී.ඒ. තිසේරා, චම්පිකා අල්විස් මෙය, එම්.පී.එම්.කේ. උදයංගනී මිය, ගයාන් ලසන්ත පෙරේරා මයා, වජිරා චිත්‍රානි මෝතා මිය, ඒ.එම්.එස්. විමලරත්න මයා, ජීවනී ආරියරත්න මෙය, ආර්.එම්.එල්.කේ. රණවීර මෙය, දෙසඳු උත්සර ලියැදිපිට මයා,

**රු.4,500 - 2,000 ත් අතර**
ඒ.බී.හේමමාලී මෙය, එස්.එන්.ගුණතිලක මිය, එස්.පී.එම්. ද සිල්වා මිය, 13 වැනි භාවනා පන්තිය, කේ.චමින්ද පෙරේරා මයා, ලුෂාන්ති ශානිකා කොඩිතුවක්කු මිය, රමණී ප්‍රනාන්දු මිය, එස්.ඩී.පුංචිහේවා මිය, තුෂාරී සාගරිකා මිය, කමනී ජයකොඩි මිය, ජේ.එස්.ගුණියන්ගොඩ මෙය, අශෝකා හේමමාලි මිය, අයි.එස්.ගජනායක මිය, සිසිර පෙරේරා මයා, පූජ්‍ය මස්තැන්නේ ඉන්ද්‍රරතන හිමි, ඒ.ඒ.සී.ස්වර්ණලතා මිය, සුනීතා ලියනආරච්චි මිය, එන්.කේ.පලිහක්කාර මිය, දයානි පෙරේරා රූපසිංහ මෙය, අයි.ඩී.වීරසිංහ මිය, මාලා පෙරේරා මිය, නාලිනී වත්තේගම මිය, කේ.ඒ.පියදාස මයා, ස්වර්ණා ගුණසේකර මිය, චන්දිම දබරේ මයා, එච්.පී.පී.හේමකුමාරි මිය, එස්.සුමනා සිල්වා මිය,

**රු.1,500 - 1,300 ත් අතර**
එච්.ඒ.පී.එස්.පෙරේරා මයා සහ මිය, එස්.ප්‍රේමදාස මිය, චන්න රාජපක්ෂ මයා, රන්ජිත් සොයිසා මයා, ශිරෝමි මිය සහ සමන් සමරජීව මයා,

**රු.1,000 ක් ආධාර කල පිංවතුන්**
උදයානි ජයසූරිය මිය, චම්පාවෝ වීරසිංහ මිය, අසේල සුභාෂ් මයා සහ ස්වර්ණමලී මිය, හිමාලි හේට්ටිආච්චි මෙය, මනෝජ් ජයසූරිය මයා, චම්පිකා සිරිබැද්දන මිය,
ඩී.සී.කේ.කේ.රාජපක්ෂ මයා, කේ.කාන්ති පෙරේරා මිය, දයානි අල්විස් මිය, සී.ඩී.කළුආරච්චි මිය, අතුල නානායක්කාර මයා, පී.ආර්.එන්.රත්නායක මිය, පද්මිණී විජේතුංග මිය, තමරා කුමාරි විජේතුංග මිය, කේ.කේ.සමරසේන මිය, සෙනරත් සමරවීර මයා, නන්ද උඩවත්ත මිය, විමලා විජේතුංග මිය, චම්පා වීරසිං[illegible] රුද්‍රා විජේරත්න මිය සහ රොබට් විජෙ[illegible] මයා, ඩී.එල්.එන්. පුල්ලේපෙරුම මයා, ප්‍රේමා සේරසිංහ මිය, එච්.ඒ.එස්.එන්. වික්‍රමසූරිය මිය, අයිරංගනී බණ්ඩාර මිය, පී. අයිරංගනී ද සිල්වා මිය, ඒ.ඒ. සුමනාවතී මිය, බී. ආරියසිංහ මිය, තාරක ජයවර්ධන මයා, ඩබ්. රණසිංහ මයා, කේ.සී. ජයවර්ධන මයා, එච්.වී.එන්. සෙනෙවිරත්න මිය, ඩබ්.ඩී.පී. ජයසිංහ මිය, ඒ.ආර්. හෙට්ටිආරච්චි මයා, ධනුෂ්ක නවරත්න මයා, ඉන්ද්‍රාණී ඩයස් මෙය,ජයා දීප්ති බණ්ඩාර මිය, රම්‍යා [illegible]ට්පන ආරච්චි මිය, ප්‍රේමරත්න සූරියාරච්[illegible] මයා, ඒ.එම්. වික්‍රමසිංහ මයා, කේ.ආර්.[illegible] චන්ද්‍රිකා ද සිල්වා මෙය, කමනි කුලරත්න [illegible]ය, එස්.එස්.එල්. ගමගේ මිය, චතුරිකා පි[illegible]මාලි මිය, ශ්‍යාමලී කරුණානායක මිය, වින්[illegible] මහේෂි මෙය,ඩබ්.එස්.ගමගේ මෙය, නදුෂා තිළිණ ද සිල්වා මයා, ඉන්ද්‍රාණි දෙඩංගොඩ මිය, තිලිණා ගනේගොඩ මිය

**රු. 999 -600 අතර**
එන්.ඩී. කදුරුවන මයා, කල්‍යාණි වීරසිංහ මිය, යූ.කේ.එම්.ඕ. උඩවත්ත මයා, මෙලා රෝෂණී මෙය, ඩී.එම්.එස්. කන්නංගර මිය, ප්‍රියවතී කඳනආරච්චි මිය, එච්.එම්. මාලනීමිය, මංජුල පද්මකුමාර මයා, මංජුල පත්මකුමාර මයා, අයි. ඒ.[illegible]ස්. ඉබුලාන මිය.

**රු. 500 ක් ආධාර කල පිංවතුන්**
හේමලතා වැලිකල මිය, ප්‍රසාදි ජයරත්න මිය, තේජා කරුණාරත්න මෙය, ඩබ්. කමලාවතී ෆොන්සේකා මිය, එච්.එම්.සුජීවා මෙය, පී.ප්‍රේමවතී මිය, නන්දසේන අකරවිට මයා, පී.කේ.ඩී. නන්ද මිය, සකුන්තලා රූපසිංහ මිය එච්.පියසීලි මිය, රත්නපාල ඉලම්පෙරුම මයා, සුචරිතා දයාරත්න මිය, ක්‍රිෂාන්ති සමරසිංහ මෙය, ඩබ්.පී. බුද්ධිසේන මයා, ශාලිකා වික්‍රමසූරිය මෙය, සී.කේ.විජේවීර මයා, ඉන්ද්‍රාණි බමුණුගේ මෙය, රන්ජනී වීරතුංග මෙය, එස්.එම්.එම්. සෝමවර්ධන මිය, කේ.එම්.එල් කුමාරිහාමි මිය, විනිතා විජේසුන්දර මිය, අමරා ජයසේකර මිය, මහේෂිකා පෙරේරා මිය, එච්.ඒ.ඩී. ශ්‍රියාණි මිය, පියසිරි මාතරගේ මයා, අමරා ජයන්ති මිය, ඩී.පී.සමරසිංහ මිය, රේණුකා විදනාරච්චි මිය, එච්.එම්.පියසීලි මිය, එල්.එච්.ඩී.පී. ද සිල්වා මිය, එච්.ඩබ්. ගුණවර්ධන මයා, රන්ජිත් වික්‍රමසිංහ මයා, කළණ ගනේගොඩ මයා, ඉෂාන්ත සමරසිංහ මයා, මල්ලිකා ද සිල්වා මිය, ආර්.ලීලාවතී පෙරේරා මිය, එස්. ජයන්ති හේමලතා මිය, චන්දිමා ධීරසිංහ මිය, චන්දිම හේවනාදුගල මයා, ඩබ්.එල්. දයාවතී මිය, ඩබ්.ආර්.එස්. විජේරත්න මිය, ඩබ්.එම්.ආර්. විජේරත්න මයා, සී.රණසිංහ මිය, ආර්.එම්. වසන්ත රණවීර මයා, දීපිකා සමරජීව මිය, එස්. සමරජීව මයා, සුජිතා මාතුපාල මිය, ඩී.ආර්. මුණසිංහ මයා, ආර්.ඩබ්. ගුණරත්න මයා, සුදුලොකුමැණිකේ මිය, එල්.හේමලතා මිය, එස්.එම්. ශ්‍රියාලතා මිය, කේ.ඒ.එස්. කාරියවසම් මිය, එන්.පී. මධුරසිංහ මිය, පී.ඩී.පී. මර්ලින් මිය, එස්.ඩී. වන්නිආරච්චි මෙය, පී.ඩී. දයානි මිය, මාධවී හේමසිරි මෙය, චිත්‍රා ද සිල්වා මිය, පී.එස්. සිරිවර්ධන මිය, එච්.එම්.කේ.ඩී. හේරත් මෙය, කේ.පී.එම්. ලියනගේ මෙය, පී.එස්.එම්. ලියනගේ මෙය, ශාන්තදරණී මෙහෙණින් වහන්සේ, ආරියකාන්ති මෙහෙණින් වහන්සේ, ටී.පී. සුනන්ද මයා, කේ. ගීතා ද අෑපා මෙය, එම්.එල්. සුනේත්‍රා මිය, ටී. විමලසේන මයා, ලලනි අල්විස් මෙය, කේ. ධර්මසිරි මයා, එස්.එන්. නානායක්කාර මිය, එස්.පී.කේ.ඩී. අයි.එස්. ජයමාලි මෙය, කේ.කාන්ති පෙරේරා මිය, එච්.ඒ.එස්. පෙරේරා මයා, කේ.එච්.එස්. මොරවක මයා, එස්.එච්. හේමපාල මයා, පී. සභද්‍රා මෙහෙණින් වහන්සේ, ධම්මවිජිතා මෙහෙණින් වහන්සේ, පී.ඩී. නිස්සංක මිය, පී.ආර්.එස්. ප්‍රනාන්දු මිය, එල්.පී. සමරවීර මිය, අමරනාත් ධීරසිංහ මයා, එල්.අයි.එම්. වික්‍රමසිංහ මෙය, නිහාල් මෙන්ඩිස් මයා, ආර්.පී. අබේගුණවර්ධන මිය, නන්ද මාලේවන මෙය, පී. මාලේවන මයා, එල්. අතුකෝරල මිය, පී.ඩබ්.පී. කුමාර මයා, කේ.පී. වීරසිංහ මයා සහ පී.ඒ. වික්‍රමසිංහ මිය, අරෝෂා ඩයස් මිය, පී.පී. ලියනආරච්චි මයා, රිමින්දි දැදියගල මෙය, එම්.බී. ජයන්ති ප්‍රනාන්දු මිය, හර්ෂණී පෙරේරා මෙය, කේ.පී.පී. අයිරංගනී මිය, පී. පද්මලතා මිය, එම්.එස්. ජයවර්ධන මයා, එම්.එන්. දහනායක මිය, චන්ද්‍රා ගුණරත්න මිය, පර්සි වීරසේන මයා, ටී.ඒ. පොඩිමැණිකේ මිය, එච්.ටී.එස්. වික්‍රමරත්න මයා, ඊ.සී. ද සිල්වා මයා, ඉන්ද්‍රාණි හේමලතා ද අෑපා මිය, එච්.එම්. රේණුකා මෙය, තාරක ජයවර්ධන මයා, එස්.එම්. ප්‍රේමසිරි මයා, ප්‍රේමචන්ද්‍ර රාජපක්ෂ මයා, රුෂාන්ති දහනායක මිය, ටී.එස්. ලක්මිණී ප්‍රනාන්දු මිය, එම්.කේ. මුණසිංහ මිය, සී.එම්. තල්ගස්වත්ත මිය, 14 වැනි භාවනා පන්තියේ සාමාජිකයින්. කේ.ඩී.එන්. ප්‍රිතිකා මිය.

11 වන පිටුවට/...

# දස අකුසල් හි ආදීනව

පූජ්‍ය වීදගම මෛත්‍රිය හිමියන්ගේ ලෝවැඩසඟරාවෙන්

## 1) ප්‍රාණඝාතය

පෙර අඟනක් එළු දෙනක ඉස සිඳා
සිය ලඟ වැලඳී ගිනිදැල් නිරය දුක් විඳා
ඇය ඇඟ ලෝම ගණනේ ඉස් කැපුම් ලද
මෙම රඟ වේය කාටත් අකුසලේ ලෙද

තේරුම ෑ- අතීතයෙහි එක් කාන්තාවක් එළු දෙනකගේ ගෙල සිඳ මුළු ශරීරයම වෙලාගත් අපායේ ගිනි දැල්වලින් දුක් විඳ ඇගේ ශරීරයේ ලෝම ගණනට හිස් කැපුම් ලැබුවාය. අකුලස කර්මය කාටත් මේ ලෙස සිදු වේ.

## 02. සොරකම් කිරිම

කෙළියට කඩක් සඟවා යහළුවෙකු ගෙනේ
එළිකොට නැවත දුන් මිනිසෙකුට එතෙකිනේ
විළි වැස්මක් නොමවිය දෙව් වුවත් අනේ
කෙළියට වත් නොකරවු සොර කමක් දැනේ

තේරුම ෑ- ක්‍රීඩා පිණිස යහළුවෙකුගේ රෙදි කැබෙල්ලක් සඟවා (එය) එළිකොට ආපසු දුන් යහළුවෙකුට ඒ තරමින්. දෙවියෙකු වීත් විළි වැසීමක් නොවීය. සෙල්ලමටවත් දැනගෙන සොරකමක් නොකරවු.

## 03. පරදර සේවනය කිරිම

නැණනැති අයෙක් පෙර පරදර පව් පැවති
ගුගු රති ගැලෙති තිස්වා දහසින් උඩෙති
නිම නැති තවම ලෝකුඹු නිරයේ පැසෙති
නොකරති මෙපව් නුවණැති අය වැඩ කැමති

තේරුම ෑ- නුවණ නැති කෙනෙක් අතීතයෙහි පරදාර කර්මයෙහි යෙදී තවම කෙළවරක් නැති ලෝකුඹු නරකයෙහි පැසෙති. (එහි) ගුගුරති. ගිලෙති. අවුරුදු තිස් දහසකින් උඩට එති. වැඩ කැමති නුවණ ඇති අය මේ පව් නොකරති.

## 05.බොරු කීම

ළැදිව රජෙක් බොරු බස් කී විගසකය
නැතිව රිද්දි බලයක් ඒ මිනිස් කය
පොළොව පලාගෙන ගොස් වැටිණි නරකය
මෙලොව සතුනි ඉන් බොරු කීම නරකය

තේරුම ෑ- රජෙක් ආශාවෙන් බොරු වචනයක් කී පමණකින් ඒ මිනිස් ශරීරයෙහි ඍද්ධි බලය නැති වී පොළොව පලාගෙන ගොස් නරකයෙහි වැටිණ. මේ ලෝක සත්ත්වයෙනි ඒ නිසා බොරු කීම නරකය.

## 05.කේළාම් කීම

පිසුණු කියා සඟ දෙනමක් වෙනස් කොට
පැසුණු එකෙක් නිරයේ කල්පයක් සිට
මුහුණු කුණුව තව පේතව විඳී ගැහැට
පිසුණු බසක් නොකියවු අද පටන් කොට

තේරුම ෑ- කේළාම් කියා සංඝයා වහන්සේලා දෙනමක් භේදකර අපායේ කල්පයක් දුක් විඳි කෙනෙක් මුහුණ කුණුවී ප්‍රේතයෙකුව ගැහැට විඳියි. ඒ නිසා අදින් පසු කේළාම් බසක් නොකියවු.

## 06.පරුෂ බස් කිම

පෙර එක් සඟෙක් සඟ ගණහට බැණ නපුරු
නිරයේ වැටිණි බිම සත් ගවු වැඩෙන තුරු
ගොරදුක් විඳී තව පේතව සිට කුරිරු
පරහට එයින් නොකියවු බස් නොපියකරු

තේරුම ෑ- ආදියෙහි එක් භික්ෂුවක් සංඝයාට පරුෂ බස් කියා පොලොව ගව්වක් වැඩෙන කල් අපායේ වැටී සිටියේය. (ඔහු) තවමත් ප්‍රේතයෙකුව කෲරවූ තද බල දුක් විඳියි. ඒ නිසා අප්‍රිය කර වචන අනුන්ට නොකියන්න.

## 07. සම්පප්ප්‍රලාප

කිවොත් වැඩක් නැති බස් ගොර නිරා ගැබේ
මහත් කුරිරු දුක් විඳ යළි අවොත් මොබේ
කිවත් සැබෑ නොගනිති ඔහුගේ බස් සබේ
ගෙවත් සසර දුක් මෙම නොකියතොත් සැබේ

තේරුම ෑ.වැඩකට නැති බස් (සම්පප්ප්‍රලාප) කථා කළහොත් ඝොර වූ නිරය තුළ කෲර දුක් විඳ නැවත මෙහි ආවොත් ඇත්තක් කීවත් ඔහුගේ වචන නොපිළිගනිති. මේවා නොකියන අය සැබවින්ම සංසාර දුක අවසන් කරති.

## 08. අභිද්‍යාව

අන් සතු දෙයක් වේවයි සිතුව තමහට
ඉන් දුගතියෙහි දුක් විඳ අව මේ ලොවට
උන් සිතුවා සිදු නොම වෙයි සිතු ලෙසට
මින් මතු සිතක් නොසිතවූ එවැනි පවකට

තේරුම ෑ-අනුන්ට අයිති දෙයක් තමන්ට ලැබේවායි සිතුවහොත් එයින් අපායෙහි දුක් විඳ මේ ලෝකයට ආවත් ඔවුන් සිතූ දෙය සිතූ ආකාරයට සිදු නොවෙයි. මෙයින් පසු එවැනි පාපිශ්ඨ සිතක් ඇති කර නොගනිවු.

## 09.ව්‍යපාදය (ක්‍රෝධය)

බෝවාදහස් පැසවන නිරය වෙන වෙන
වෑපාද නම් රුදු මන බව නපුරු වන
ආබාද දුක් විඳුවන උපනූපන් තැන
වෑපාදයක් නොසිතවූ දැන දැන සිතින

තේරුම ෑ- වෙන වෙන අපායවල් අවුරුදු බොහෝ දහස් ගණනක් දුක් විඳුවන්නා වූ ව්‍යාපද නම් වූ නපුරු මනසක් ඇති බවය. උපන් උපන් තැන කරදර දුක් විඳුවන්නා වූ ක්‍රෝධයක් දැන දැන සිතින් නොසිතවූ.

## 10.මිත්‍යාදෘෂ්ටිය

කලක් නිරා දුක් විඳ විටක ගොඩ දුටු
නොයෙක් රෝග අටගෙන ගතවෙයි අරිටු
උදයක් නුවණ නැති වේ සිත වෙයි කිලුටු
මෙවක් පටන් විස මෙන් සිතව මිසදිටු

තේරුම ෑ- කාලයක් අපායේ දුක් විඳ ඉන් මිදුණු කල්හිද නොයෙක් රෝග ඇති වී අප්‍රිය වෙයි. නුවණ මුළුමනින් නැති වෙයි. සිත කිලුටු වෙයි. (ඒ නිසා) මෙතැන් සිට මිත්‍යාදෘෂ්ඨිය විස මෙන් සිතවු.

මේ දස අකුසලි, ඉනෙකක් කළහොත්
උපදෙසකින් බසකින් කරවූවොත්
ඒ විගස එක් අදහසකින් සිතුවොත්
නොවලස මොහු සෑම දෙන නිරයට යෙත්

තේරුම ෑ- මේ දස අකුලස්වලින් එකක් කළහොත් (නැත්නම්) වචනයකින් හෝ උපදේශයකින් කරවූවහොත් ඒ සමඟම ඊට එකඟ වුවහොත් ප්‍රමාදයකින් තොරව මොවුහු සියලු දෙනාම අපායට යති.

ඉහත දස අකුසලයෙන් වැලකීම පිණිස දසකුසල් සදහන් ආජීව අෂ්ඨමක ශිලය නිති රකින්න.

කරදර දස අකුලසලයෙන් නොමිදී
වැර සැර පෑවොත් මෙමිනිස් ලොව දී
මෙරගිර මුදුනෙන් හුණු මෙන් නොරැඳී
පරතෙර නැති දුක සඅයුරේ කිමිදී

තේරුම ෑ- කරදරකාරී දස අකුසල්වලින් වෙන් නොවී, මේ මනුෂ්‍ය ලෝකයේදී සැර වැර පෙන්වුවහොත්, මහාමේරු පර්වතයෙන් නොරැඳී වැටුණාක් මෙන් කෙළවරක් නැති දුක් සයුරේ ගිලී යයි.

## 2008-12-07 දින ත්‍රෛමාසික දන-සීල-භාවනා වැඩසටහන - කලපළුවාව තපොවනය රාජගිරිය


















සමූහයා සමග හැසිරෙනවිට තමාගේ සැප පහසුව නොතකා අන්අයගේ සැප පහසුව සලසන්න - යෝගී චින්තා

# අසූ මහා ශ්‍රාවකයින් වහන්සේලා



## අඤ්ඤා කොණ්ඩඤ්ඤ මහ රහතන් වහන්සේ.

සම්බුද්ධ ශාසනයෙහි ප්‍රථමයෙන් ම පැවිදිව ධර්මාවබෝධය ලැබූ මුල්ම ශ්‍රාවකයන් වහන්සේ අඤ්ඤාකොණ්ඩඤ්ඤ මහ රහතන් වහන්සේය. ඒ නිසාම උන්වහන්සේ 'රත්තඤ්ඤූ' හෙවත් පැවිදිව බොහෝ කල් ඉක්මවූ භික්ෂූන් අතරින් අග්‍රස්ථානය ලත් සේක. මේයින් කල්ප ලක්ෂයකට පෙර පහලවූ පදුමුත්තර නම් බුදුරජාණන් වහන්සේ ගෙන් නියත විවරණ ලැබූ මුන් වහන්සේ එතෙක් පටන් කල්ප ගනනාවක් දෙව් මිනිස් ලෝකවල වරින් වර ඉපදෙමින් දනාදි අපමණ පින් කම් කොට අප ගෞතම බුදුරජාණන් වහන්සේ ලොව පහල වන සමයේ කිඹුල්වත් නුවරට නුදුරුව බ්‍රාහ්මණ පවුලක කොණ්ඩඤ්ඤ නමින් උපන්නේය.

අප මහ බෝසතාණන් වහන්සේ ට නම් තබන දවස, වැඩිමහළු බමුනණන් සත් දෙනා ඇඟිලි දෙකක් ඔසවා පැවිදි වන්නේ නම් බුදුවන බවත්, ගිහිගෙයි වසන්නේනම් චක්‍රවර්ති රජකු වන බවත් පැවසූ අතර, මෙම කොණ්ඩඤ්ඤ බමුණා එක් ඇඟිල්ලක් ඔසවා කුමාරයා කිසි විටක ගිහිගේ නොවසන බවත්, ඒකාන්ත වශයෙන් පැවිදිව බුදුවන බවත් පැවසීය.

සිද්ධාර්ථ කුමරයානෝ ගිහිගෙයින් නික්ම පැවිදිවූ පසුව කොණ්ඩඤ්ඤ බමුණා තවත් බමුණු තරුණයන් හතර දෙකනු සමග පැවිදිව උරුවෙල් දනව්වට ම පැමිණ උන්වහන්සේ සමග එක්ව තවුස් දහම් රැක්කාය.මහ බෝසතාණන් වහන්සේ උග්‍ර තපස් දම් පුරමින් දුෂ්කර ක්‍රියා කොට පසුව ඒ මගින් විමුක්තිය නොලැබෙන බව අවබෝධ කොට, ඒ අන්තය අතහැර මැදුම්පිලිවෙතට බැස ලිහිල් පිලිවෙතක් අනුගමනය කල බැවින්, උන්වහන්සේ කෙරේ නොසතුටට පත් පස්වග තවුසෝ බෝසතාණන් අත හැර ගියාහුය .

මැදුම් පිලිවෙත වඩා සියලු කෙලෙසුන් නසා සම්මා සම්බුද්ධත්වයට පැමිණ වදළ බුදුපියාණන්වහන්සේ උන්වහන්සෙගේ පලමු ධර්මදේශනාව වන උතුම් 'ධම්සක් පැවතුම් සූත්‍රය' පස්වග තවුසන් සදහා බරණැස ඉසිපතනාරමයේදි දේශනාකොට වදලහ. දේශනාව අවසානයේදි කොණ්ඩඤ්ඤ තවුසානෝ දහසක් නයින් ප්‍රතිමණ්ඩිත උතුම් සොවාන් ඵලය ලැබුහ. පසුව දේශනා කරණ ලද අනන්ත ලක්ඛණ සූත්‍ර දේශනාවෙන් උන්වහන්සේ රහත් වූ සේක. බුදුන් වහන්සේ එක් දිනක ජේතවනාරාමයෙහි දී, භික්ෂූන් මධ්‍යයෙහි 'ආර්යධර්ම ප්‍රතිවේධ කළ භික්ෂූන් අතරෙහි මගේ පුතුවූ කොණ්ඩඤ්ඤ නම් භික්ෂු තෙම අග්‍රයයි,' අග්‍රස්ථානයෙහි තබා වදළ සේක. අතිශයින්ම නිහතමානී ගුණ ඇති උන්වහන්සේ සැරියුත්, මුගලන් යන දෙනම ඇතුලු අනෙකුත් භික්ෂූන් වහන්ස්ලාගේ ගරු සැලකිලි නොඉවසූ අතර සමූහයා සමග එකට ජීවත් වීම දුෂ්කර බැව් බුදුරජානණාන්වහන්සේට පවසා වැද අවසර ගෙන, ඡද්දන්ත විල්තෙරට ගොස් ඡද්දන්ත ඇත් සමූහයා සමග දෙලොස් අවුරුද්දක් කල් වාසය කොට එහිදීම පිරිණිවන් පෑසේක.

## මහා ප්‍රඥාවතුන් ගෙන් අග්‍රස්ථාණය ලැබූ සාරිපුත්ථ මහ රහතන් වහන්සේ

උපතිස්ස නම් බමුණුගම සාරි නම් බැමිණියගේ කුසින් උපතිස්ස නමින් මෙලොව එලිය දුටු මෙතුමානෝ වැඩිවිය පැමිණ තම මිත්‍ර කෝලිත නම් තරුණ මාණවකයා සමගින් රජගහ නුවර පවත්වන ලද 'ගිරග්ග සමජ්ජ' නම් වූ උත්සවයක් බැලීමට ගොස් ජීවිතය ගැන කලකිරී ගිහිගෙයින් නික්ම සංජය පරිබ්‍රාජකයා හමුවේ පැවිදිවුවේය. මෙතුමාගෙන් දැනුම ලබා ගත් කොලිත තරුණ පරිබ්‍රාජකයා විමුක්ති මාර්ගය සොයා ගත හැකි වෙනත් ශාස්තෘ වරයකු සොයා යන අතර මගදී, පිඬු සිඟාවඩිණ අස්සජි මහ තෙරුන් වහන්සේදැක ,උන්වහන්සේ පිළිබඳ වූ පැහැදීම නිසාම තොරතුරු විමසූ කල්හි, බුදුරජාණන්වහන්සේ පිළිබඳව දන්වා, උන්වහන්සේ දේශනා කරන්නාවූ දහම එකට එකතු කොට හකුළුවා, සතර පද ගාථාවක් තුලින් දැක්වීය.

යෙ ධම්මා හේතුප්පභවා - තෙසං හේතුං තථාගතො ආහ
තේසංච යො නිරොධො - එවංවාදී මහා සමණො'

මෙම ගාථා ධර්මයේ මුල්පද දෙක අසනවාත් සමගම උපතිස්ස පරිබ්‍රාජක තෙමේ දහසක් නයින් ප්‍රතිමණ්ඩිත උතුම් වූ සෝවාන් ඵලයෙහි පිහිටියේය. හෙතෙම තම මිතුරා ද සමගින් බුදුන්වහන්සේ හමුවට ගොස් පැවිදිවුහ.බුදුන්වහන්සේගේ අග්‍ර ශ්‍රාවක වීම, මහා ප්‍රඥාවන්ත භික්ෂූන් අතරින් අග්‍රවීම,ධර්මසේනාධිපති වීම යන ප්‍රධාන ස්ථානතුනක්ම උන් වහන්සේට හිමිව තිබුණි.
අප භාග්‍යවතුන් වහන්සේ පිරිණිවන් පෑමේ අධිෂ්ඨාන ඇතිව අන්තිම වස් කාලය ගෙවන සමයෙහි, උන් වහන්සේ ගෙන් අවසර ගත් සැරියුත් මහ

තෙරුන්වහන්සේ , නාලක නම් ග්‍රාමයේ පිහිටි, තම උපන් නිවසට පැමිණියහ. මෙතෙක් මිථ්‍යාදෘෂ්ටි අත් නොහැරි තම මෑණියන් සම්‍යග්දෘෂ්ටියෙහි පිහිටවූ මහ තෙරුණ්වහන්සේ එදින රාත්‍රියේදී දහම් දේශනාකොට රූපසාරි බැමිණිය සෝවාන් ඵලයට පත් කල අතර අලුයම් වේලෙහි තම උපන්නිවසේදී ම නිරුපධිශේෂ නිර්වාණ ධාතුවෙන් පිරිණිවන්පා වදළ සේක.

## මුගලන් මහ රහතන් වහන්සේ


'සෘද්ධියෙහි පරතෙරට ගොස්, සෘද්ධියෙහි කෙළ පැමිණ සිටින මම ක්‍ෂණයක් ඇතුලත කෝටි ලක්‍ෂයක් ආත්ම භාවයන් මවන්නෙමි, සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ අවසරය ලැබූ මම භික්‍ෂු සංඝයා බලා සිටියදීම,වම්පයේ මහපට ඇඟිල්ලෙන් මිගාරමාතු ප්‍රාසදය පවා (පූර්වාරාමය)කම්පා කෙරුවෙමි.' 'සෘද්ධියෙහි පරතෙරට ගොස්,සෘද්ධියෙහි කෙළ පැමිණ සිටින මම, ඉතා ගැඹුරුවූ ඝන වූ , සෙලවීමට නොහැකි මේ මහ පොලොව , වම්පයේ මහපට ඇඟිල්ලෙන් සොලවන්නෙමි.'

' මම ය, මාගේ ය, යන හැඟීම මට නැත. මා විසින් සියලු රාග, ද්වේෂ, මෝහාදී සකල ක්ලේශයන් දවන ලදී. සියලු භවයන් සිඳ බිඳ විනාශ කර දමන ලදී. දැන් මම සියලු බැම් බිඳදැමූ ඇත් රජෙකුසේ සියලු ආශ්‍රව නසා සුවසේ වාසය කරමි.' මේ මුගලන් මහ රහතුන් වහන්සෙගේ උදණ වාක්‍යයයි.

රජගහ නුවර ඉපිද කෝලිත යන නම ලැබුමුත්, 'මොග්ගල්ලාන' සහ 'මොග්ගලී' යන බමුණු දෙමාල්ලන්ට දාව උපන් බැවින් 'මොග්ගල්ලාන' (මුගලන්) නමින් ප්‍රකටවිය. තම මිත්‍ර උපතිස්ස පරිබ්‍රාජකයා හට අස්සජි මහ රහතුන් වහන්සේ දේශණාකරන ලද ගාථා පාඨය ශ්‍රවණය කිරිමෙන් උතුම් සෝවාන් මාර්ගයට පත්වූ මෙතුමා බුදුන් වහන්සේ හමුවේදී 'ඒහි භික්‍ෂු' භාවයෙන් පැවිදි උපසම්පද විය.

මුගලන් මහ රහතන් වහන්සේ රහත් භාවයට පත්වීමෙන් පසු, ගෞතම බුද්ධ ශාසනය තුළ දෙවන අග්‍ර ශ්‍රාවකවීම, සෘද්ධිමත් භික්‍ෂුන් අතරෙන් අග්‍රවීම, ධර්ම පුරෝහිත වීම යන ප්‍රධාන ස්ථානාන්තර තුනක් ම හිමි වී තිබුණි.

එක් දිනක් තීර්ථකයන් ගෙන් අල්ලස් ලබාගත් පල්හොරු පිරිසක් අප බුදුන්වහන්සෙගේ දෙවන අග්‍ර ශ්‍රාවක ඉන්ද්‍රණීල මාණික්‍ය රත්නයක් බඳු මහා සෘද්ධිමත්, මහනුභාව සම්පන්න මහ මුගලන් මහ රහත් තෙරණුවෝ සිටි කුටිය වැටලුහ. උන්වහනසේ අනතුරක් බැව් දැනගෙන මැස්සෙක් ගේ වේශයක් මවා ගෙන දෙරේ යතුරු සිදුරෙන් රිංගා පැනගොස් දිව්රැකගත් මුත් තමන් වහන්සෙගේ පෙරභවයක කර්මයක් පලදීමට ඇති බැව් දැක සොරුන්ට මුහුනදී උන්ගෙන් තම සිරුර කුඩුවෙනතුරු පහරකා සිරුර නිල් පැහැ ගැන්වීතිබියදී බුදුන් වහන්සේ බැහැදැකීය. ඉන්පසු බුදු සිරිපතුල් වැද අවසර ගෙන විදුලි වේගයෙන් අහසට පැන නැගී පෑමට ඇතිතරමේ යම්තාක් ප්‍රාතිහාර්යන් ඇත්ද, ඒ තාක් සියලු ප්‍රාථිහාර්යන් පා අහසේම සිට දහම් දෙසා බිමට බැස 'ස්වාමීණි පිරිණිවන් පාන්නෙමි, ස්වාමීණි පිරිණිවන් පාන්නෙමි,'යි කියා බුදු සිරිපතුල් සිඹ වන්දනා කොට සියලු භික්‍ෂු සංඝයාගෙන් ද සමු ගෙන අහසට පැන නැගී කාළසිලා පර්වතයට වැඩමකොට පණාවා තිබූ ඇදට වැඩ යලිත් නොනැගිටින අදහසින් දකුණු ඇළයෙන් සැතපී අලුයම් කාලයේ දී, පිරිනිවන් පෑ සේක.



තුන්වන පිටුවෙන් ........

### 2009-09-19/20 සඳහම් චාරිකාව - අනුරාධපුර රත්නමාලී විශ්‍රාම ශාලාවේ කාමර වෙන්කිරීමට විස්තර

නව ශාලාව

| කාමර ගණන | කාමර අංක | එක කාමරයක සිටිය හැකි සංඛ්‍යාව | කාමරයක් සඳහා මුදල රු. | පහසුකම් (වැසිකිලි නාන කාමර) |
|---|---|---|---|---|
| 13 | 66,67,68,69,70,71 75,76,77,79,80,81,82 | 03 | 1150/- | ඇත |
| 01 | 78 | 05 | 1950/- | ඇත |
| 01 | 74 | 05 | 1700/- | ඇත |
| 01 | 73 | 02 | 700/- | ඇත |

පැරණි ශාලාව

| | | | | |
|---|---|---|---|---|
| 04 | 01,02,03,04 | 02 | 675/- | ඇත |
| 05 | 14,15,16,17,18 | 02 | 750/- | ඇත |
| 04 | 28,29,30,31 | 02 | 575/- | ඇත |
| 01 | 09 | 02 | 400/- | පොදු |
| 01 | 12 | 03 | 400/- | පොදු |
| 13 | 05,06,07,08,10,11, 19,20,21,22,23,24,26 | 02 | 350/- | පොදු |

ලොකු ගෙය

| | | | | |
|---|---|---|---|---|
| 04 | 60,61,62,63 | 08 | 575/- | පොදු |

පොඩි ගෙය (කබානා)

ඇඳන් 04 ක් සහ වැසිකිලි පහසුකම් ඇත රු.2300.00


පොදු ශාලාව


ඇඳන් නැත. 20 දෙනෙකුට පමණ සිටිය හැක එක් අයෙකුට රු.200.00 ඇතිරිලි/කොට්ට ආදිය සපයා ගත යුතු වේ. ශාලාව හොඳින් ආවරණය කර ඇත. ඇඳුම් මාරුකිරීම ආදීයට පහසුකම් ඇත

# මෙත්සවිය සිව්වන මහසමුළු උත්සවය

මෙත්සවිය සිව්වන මහසමුළු උත්සවය අතිඋත්කර්ශවත් අන්දමින් 2009-01-04 වන දින ප.ව. 2.30 කොළඹ 07, බෞද්ධාලෝක මාවතේ පිහිටි ධර්ම ගවේශී බෞද්ධාශ්‍රම ශාලාවේදී පැවැත්වුනු අතර එදින සිදුකල සුවිශේෂී සිදුවීමක් ලෙසින්, ශ්‍රී ලංකාව තුල ඉමහත් කීර්තියක් අත්පත් කරගෙන සිටින දෙපළක් විසින් කරන ලද විශිෂ්ඨ ජාතික මෙහෙවර උදෙසා උපහාර සම්මාන ඔවුන් වෙත පිරිනැමීමක් සිදුකෙරුණි. එදින විශේෂ අමුත්තන් දර්ශණීය පෙරහැරකින් ශාලාව වෙත කැඳවාගෙන පැමිණි අතර ශ්‍රී ධර්ම රක්‍ෂිත අමරපුර මහා නිකායේ මහානායක ධුරන්දර රාජකීය පණ්ඩිත වැලිගම ශ්‍රී ඤාණරතන මහානායක හිමියන් විසින් මුලසුන හෙබවූහ.

විශිෂ්ඨ සම්මාන ලාභීන් වන කලාසූරි අරිසෙන් අහුබුදු සූරින් සහ අයිරාංගනී ද සිල්වා මැතිනියට උපහාර සම්මාන සඳහා පහත සඳහන් හේතුපාඨ කියවන ලදී.



## සිද්ධි රස්තු

මෙත්සිත් පෙර දැරි ජාතික මෙහෙවර, විශිෂ්ඨ සේවය හා ප්‍රවීනතාවය උදෙසා පිරිනැමෙන උපහාර සම්මානයයි.

බුදු දම් සඟ යන ලොවුතුරු තෙරුවන ද
දෙස බස රැස යන ලෙව් රුවන ද ළෙහි ලා
සුරකිමින්, සිරි දෙසුම, මහ සිහිවටන, තෙරුවන
නැමැඳුම ඈ පත පොතහි
හෙළ බසින් බුදු දහම පැතිරැවීම පිණිස ද
දැයෙහි යටගිය උරුමය මතු කරනු පිණිස ද
බසෙහි සැඟවුණු නිරුත් මග හෙළි
කරනු පිණිස ද,
අසම රන් මෙහෙවරක් කළ

## කලාසූරි අරිසෙන් අහුබුදු සූරිනට

මෙත් සවියෙන් මෙසේ ගරු උපහාර සම්මානය වන
මෛත්‍රී භූෂණ හෙළ වදනිසුරු
ගෞරව නාම සම්මානය
සිරි බුදු වසින් 2552 දුරුතු මසැ පුර අටවක්
ලක් රිවි දින හෙවත් ව්‍යාවහාර වර්ෂයෙන්
2009 ජනවාරි 4 ද කොළඹ 07, බෞද්ධාලෝක
මාවතේ පිහිටි ධර්ම ගවේෂී බෞද්ධාශ්‍රමයේදී
පවත්වන්නට යෙදෙන මෙත්සවිය මහසමුළු උත්සව
සභාවේදී ප්‍රදානය කල වගයි.

## සිද්ධි රස්තු

මෙත්සිත් පෙරදැරි ජාතික මෙහෙවර, විශිෂ්ඨ සේවය හා ප්‍රවීනතාවය උදෙසා පිරිනැමෙන උපහාර සම්මානයයි.

"සබ්බේසං ජීවිතං පියං" යන බුදු වදන මුළු හදින් ගෙන,
මවක එක් ම පුතු කෙරෙහි විහිදුවන දයා-මෙත්-කුලුණු
ගුණය සව් සතන් වෙත දක්වමින්. වදනින් කිය නොහැකි
වද හිංසාවලට ගොදුරු කොට මරනු ලබන ගවයන් ඇතුළු
සියළු සතුන් හේ දිවි අයිතිය වෙනුවෙන් නොබිය ව,
නොගැති ව පෙනී සිට දහසකුත් එකක් නින්ද තර්ජන
හමුවේ වුවද නොසැලී දිවි පරදුවට තබා ලක්දිව සත්ත්ව
හිංසනය වැළැක්වීමේ නීති බලවත් කොට ඒවා ක්‍රියාවට
නැංවීමට කළ අම්ල මහ මෙහෙවර උදෙසා

## අයිරාංගනී ද සිල්වා මැතිනියට

මෙත් සවියෙන් මෙසේ ගරු උපහාර සම්මානය වන
මෛත්‍රී භූෂණ අහිංසා සාධනී
ගෞරව නාම සම්මානය
සිරි බුදු වසින් 2552 දුරුතු මසැ පුර අටවක්
ලත් රිවි දින හෙවත් ව්‍යාවහාර වර්ෂයෙන්
2009 ජනවාරි 4 ද කොළඹ 07, බෞද්ධාලෝක මාවතේ
පිහිටි ධර්ම ගවේශී බෞද්ධාශ්‍රමයේදී
පවත්වන්නට යෙදෙන මෙත්සවිය මහසමුළු උත්සව
සභාවේදී ප්‍රදානය කල වගයි.

# භවාංග සිත යනු කුමක්ද?

සත්වයකු භවයේ ප්‍රථම කොට උපදනා කල්හි ඔහුගේ අතීත භවයේ මරණාසන්න චිත්තයන්ට අරමුණු වූ කර්මය, කර්ම නිමිත්ත, ගති නිමිත්ත යන තුන අතරෙන් එක් දෙයක් අරමුණු කොට භවයේ පළමු වන සිත අතීත කර්මයක විපාක වශයෙන් උපදී. ඒ පළමු වන සිත ඉපදීමෙන් සත්වයා උපන්නේය යි ද අභිනව භවයට පැමිණියේ යයි ද කියනු ලැබේ. අභිනව භවයෙහි පළමු කොට උපදනා ඒ සිත අතීත භවය හා වර්තමාන භවය සම්බන්ධ කරන්නක් වැනි බැවින් එයට ප්‍රතිසන්ධි චිත්තය යන නම කියනු ලැබේ.

චිත්තයාගේ ආයුෂය ඉතා කෙටි බැවින් එය සැණෙකින් බිඳෙන්නේ ය. එක පිට එක පිහිටි වස්තු සමූහයක යටි දෙය ඇද ගතහොත් එය මත තිබෙන දෙය එතැනට වහා පැමිණෙන්නාක් මෙන් ප්‍රතිසන්ධි සිත නිරුද්ධ වනු සමග ම චිත්ත පරම්පරාවේ අතරක් නො දැනෙන ලෙස ඒ ප්‍රතිසන්ධි චිත්තයෙන් ගත් අරමුණ ම ගෙන ප්‍රතිසන්ධි චිත්තය හා සර්වාකාරයෙන් සමාන වූ සිතක් ඉපදීම් වශයෙන් එතැනට පැමිණේ. එය නිරුද්ධ වනු සමග ම ඒ ජාතියේ ම තවත් සිතක් එතැනට පැමිණේ. මෙසේ ඒ සිත් පරම්පරාව අන් සිතක් උපදනා සෑම අවස්ථාවකදී ම පවත්නේ ය. භවය යනු ද සත්ත්වයා යනු ද පුද්ගලයා යනු ද එසේ එකින් එකට පෙර පසුවී උපදනා නාමරූප ධර්ම පරම්පරාවන්ට කියන නාමයෝය. ඒ නාමරූප ධර්ම පරම්පරාවන් ගේ නොසිඳී පැවැත්වීමට ප්‍රතිසන්ධි චිත්තයෙන් පටන් ගත් ඒ චිත්ත පරම්පරාව අතිශයින් උපකාර වන බැවින් එයට භවාංග යන නම ව්‍යවාහාර කරනු ලැබේ. අංග යනු අර්ථ කීපයක වැටෙන නාමයකි. භවාංග යන තන්හි අංග යන වචනය වැටෙන්නේ ''හේතුව'' යන අර්ථයේහි ය.

''භවාංග'' චිත්ත යන වචනයේ තේරුම භවයාගේ පැවැත්මට ඉවහල් වන සිත ය යනුයි. රූපාදි නානාරම්මණයන් ගන්නා වූ ද, නා නා ක්‍රියාවන් සිදු කරන්නා වූ ද, ආගන්තුක චිත්ත පරම්පරාවෝ භවාංග චිත්ත පරම්පරාවෙන් ම නැග එන්නෝ ය. අන් කරුණක් පිළිබඳ වූ සිත් නූපදනා සෑම අවස්ථාවේ ම භවාංග චිත්ත පරම්පරාව නො සිඳී පවතී. ඒ භවාංග චිත්තයට මූල චිත්තය යි ද ප්‍රකෘති චිත්තය යි ද කියනු ලැබේ. නොයෙක් කරුණු පිළිබඳ ව උපදනා වීථි චිත්තයන්ගේ උත්පත්තියට හේතු වන බැවින් එයට මනෝද්වාරය යි ද කියනු ලැබේ.

බුදුන් වහන්සේ විසින් ''පභස්සරමිදං භික්ඛවෙ චිත්තං'' යි සිත පැහැපත් දෙයකැයි වදාළේ ද මේ භවාංග චිත්තය ගැන ය. එහි පැහැපත් බව නම් පරිශුද්ධත්වය යි. ඒ පරිශුද්ධත්වය ඔපයක් වැනි ය. සමීපයේ ඇති දේවල ඡායා තමන් තුළට ගන්නා බව ඔපයේ ස්වාභාවය ය. එබඳු ස්වාභාවයක් භවාංග චිත්තයෙහි ඇත්තේ ය. රූප ශබ්දදි සකලාරම්මණයන්ගේ ම ඡායා භාවාංග චිත්තයෙහි ස්පර්ශ වන්නේ ය. ඒ අරමුණු චක්ෂුරාදියෙහි සැපුණෝ වී නමුත් මනෝද්වාර සංඛ්‍යාත භවාංග චිත්තයේහි නො සැපුණෝ නම් දැකීම් ඇසීම් ආදි වශයෙන් පහළ වන සිත් පහළ නොවේ. සිත් පහළ වනුයේ භවාංග චිත්තයෙහි අරමුණු ගැටීමෙන් ය. භවාංග චිත්තයෙහි අරමුණු ගැටීම පඤ්චද්වාරානුසාරයෙන් ද වේ. පඤ්චද්වාර සම්බන්ධයක් නැතිව ද වේ. යම් කිසි අරමුණක් භවාංග චිත්තය නමැති ඔපයෙහි නො සැපුණ හොත් එතෙක් ඒ පුද්ගලයාගේ සන්නානයෙහි භවාංග සිත් ම මිස අනෙකක් පිළිබඳ සිතක් නූපදී. නිදන අවස්ථාව සත්වයන් තුළ භවාංග සිත් පමණක් උපදනා අවස්ථාවෙකි. එහෙත් සිහින දැකීම වනුයේ භවාංගයෙහි අරමුණු ගැටී වීථි සිත් පහළ වීමෙනි.

සාමාන්‍යයෙන් සෑම භවාංග සිතක ම ආරම්මණ ඡායාවන් වැටීමට සුදුසු වන පැහැපත් බවක් ආලෝකවත් බවක් ඇත ද, ඒවායේ වෙනස් කම් තැත්තේ නො වේ. සෑම මැණිකක ම පැහැපත් බවක් ඇත ද, ඒවායේ හොඳ නරකකම්වල සැටියට පැහැපත් බැව්හි අඩු වැඩි කම් ඇතුවල් මෙන් භවාංග සිත්වල සැටි සැටියට ඒවායේ පැහැපත් බැව්හි අඩු වැඩි කම් ඇතුවාක් මෙන් භවාංග සිත්වල සැටි සැටියට ඒවායේ පැහැපත් බැව්හි අඩු වැඩි කම් ඇත්තේ ය. යමක පැහැපත් බව ඔපය යම් පමණකට වැඩි නම් එපමණට සියුම් සියුම් දේවල ඡායා ද එහි පහළ වී පෙනීම ද අඩු වේ.

එමෙන් භවාංග චිත්තයා ගේ පැහැපත් බව ආලෝකවත් බව යම් පමණකට වැඩි නම් ඒ ඒ පමනට සියුම් වූ ද ගැඹුරු වු ද අරමුණු භවාංග චිත්තයේ සැපේ. යම් යම් පමණට ඒ පැහැපත් බව අඩු වී නම් ඒ ඒ තරමට සියුම් සියුම් වු අරමුනු වල එහි ගැටීම අඩු වේ. සත්ත්වයන්ගේ දැනීම පිළිබඳ අඩු වැඩි කම් වනුයේ භවාංග චිත්තයාගේ ශුද්ධාසුද්ධත්වයේ ප්‍රමාණයට ය. ශුද්ධ වු ඇසට ඉතා කුඩා වස්තූත් ගේ ද, දුර තිබෙන වස්තූන්ගේ ද ඡායා වැටේ. එබැවින් ශුද්ධ ඇස් ඇතියහුට ඉතා කුඩා වස්තු හා දුර තිබෙන වස්තු ද පෙනේ. එමෙන් සුපරිශුද්ධ භවංග චිත්තයෙහි සියුම් වූ ද ගැඹුරු වූ ද කරුණු ගැටෙන නිසා සුපරිශුද්ධ භවාංගයට සියුම් වූ ද ගැඹුරු වු ද කරුනු හසුවනුනිසා සුපරිශුද්ධ භවංග චිත්තය ඇති පුද්ගලයාට සියුම් වූද ගැඹුරු වු ද කරුනු අරමුණු කරන්නාවු සිත් පහළවේ. එබැවින් ඔහුට සෙස්සන්ට දැනගත නො හෙන සියුම් ගැඹුරු වු කරුණු දත හැකිවේ. ලෝකයෙහි නුවණැති අයය, ඉගෙනීමේ සමත් අයය, සිතීමේ විමසීමේ කල්පනා කිරීමේ සමත් අයයයි කියනුයේ සුපරිශුද්ධ භවාංග චිත්තය ඇතියවුන්ට ය.

වාතයෙන් හෝ පිතෙන් හෝ සෙමෙන් හෝ ලෙයින් හෝ බොර වූ ඇසෙහි සියුම් වූ ද දුර තිබෙන්නා වූ ද වස්තූත් ගේ ඡායා නො වැටෙන බැවින් එබඳු ඇස් ඇති තැනැත්තාට සියුම් වූ වස්තු හා දුර තිබෙන වස්තු නො පෙනේ. එමෙන් පිරිසිදු බව මඳ වූ දුබල වූ අඳුරු වූ භවාංග චිත්තයෙහි සියුම් වූ ද ගැඹුරු වූ ද කරුණු නො සැපෙන බැවින් එබඳු භවාංග චිත්තයට සියුම් වු ගැඹුරු වු කරුණු නො හසු වන බැවින් අපිරිශුද්ධ භවාංග චිත්තය ඇතියන් ගේ සන්තානයන්හි සියුම් වූ ගැඹුරු වූ කරුණු අරමුණු කරන්නා වූ සිත් නූපදී. එබැවින් එබඳු පුද්ගලයන්ට දුරවබෝධ වූ ගැඹුරු වූ කරුණු නො දැනේ. අනුන් කියනු ඇසුයේ ද අවබෝධ නො වේ. පොත්පත කියවුයේ ද ඒවායේ දැක්වෙන ගැඹුරු කරුණු අවබෝධ නො වේ. ලෝකයෙහි මෝඩයෝ ය, උගෙනීමට කල්පනා කිරීමට අසමත්තු යයි කියනුයේ පැහැපත් බව, පිරිසිදු බව මඳ වූ භවාංග චිත්තය ඇතියවුන්ට ය.

භවාංග චිත්තය අතීත කර්ම හේතුවෙන් වන්නක් බැවින් එක් සත්වයකු හට එක් ජාතියකදී ඇති වන්නේ එක ම වර්ගයේ භවාංග සිත් ය. උත්පත්තියෙන් අඳුරු වූ දුබල වූ භවාංග චිත්තයක් ලැබූ, ගැඹුරු කරුණු දත හැකි සිත් පහළ නොවන්නා වූ පුද්ගලයකු පසු කාලයේ දී යම්කිසි උපක්‍රමයකින් ආලෝකවත් භවාංග සන්තානයක් ඇතියකු නො කළ හැකි ය. උත්පත්තියෙන් ම හිමි වු මෝඩ කම මහලු වූවත් එසේ ම පවත්තේ එහෙයිනි.

බුදුන් වහන්සේ විසින් :
යාවජීවම්පි වෙ බාලො - පණ්ඩිතං පයිරුපාසති
න සො ධම්මං විජානාති - දබ්බී සූපරසං ය ථා

යනු වදලේ ද එහෙයිනි. ''කොතෙක් කල් හැඳි ගෑවත් ගෙවි යනු මිස සැන්ද ව්‍යඤ්ජන රසය දැන ගැනීමට නොසමත් වන්නාක් මෙන් බාලයා දිවි ඇති තාක් පණ්ඩිතයන් ඇසුරු කළේ ද ධර්මය නොම දැන ගන්නේය.'' යනු එහි තේරුමයි.

කර්මය ද සිත පිළිබඳ පවත්නක් බැවින් සිත සේ ම විචිත්‍රය. භවාංග චිත්තයා ගේ නානත්වය සිදු කරන්නේ කර්මය ය. මුහුණ නිසා කැඩපතේ පහළ වන ඡායාව

මුහුණට අනුව ස්වාභාය නොඉක්මවා පහල වන්නාක් මෙන් කර්ම හෙතුවෙන් උපදනා භාවාංග චිත්තය කර්ම ස්වභාවය නොඉක්මවා කර්මයට අනුව උපදී. එබැවින් කර්මනාතත්වයෙන්


භාවාංග චිත්තයාගේ නානත්වය වේ.

කර්මය කුශලාකුශල වශයෙන් දෙවැදෑරුම් වේ. අඳුරු ය. අකුශල කර්මය කිලිටි බැවින් එහි විපාක වශයෙන් පහළ වන්නවු භවාංග ද සියුම් අරමුණු, ගැඹුරු අරමුණු ගැනීමට අපොහොසත් අඳුරු භවාංග යක් වෙයි. තිරිසනනුන්ට ඇත්තේ අකුශල කර්මයෙන් ජනිත භවාංග සන්නත්යෙකි. එබැවින් ඔවුහු මිනිසුන් දැන ගන්නා වූ, මිනිසුන්ට දත හැකි වූ කරුණු දැන ගැනීමට නො සමත් වෙති. තිරිසනුන් පමණක් නොව සතර අපායට ම අයත් සත්ත්වයෝ අකුශල විපාක භවාංග ඇත්තෝ ය.

කුශලය ද ඥාන සම්ප්‍රයුක්ත කුශලය ඥාන විප්‍රයුක්ත කුශලයයි දෙවැදැරුම් වේ හීන වූ ඥාන විප්‍රයුක්ත කුශල කර්මයෙන් හීනවූ අහේතුක භවාංගයක් උපදවනු ලැබේ. එය චිත්තාංග වශයෙන් අකුශල කර්මයෙන් උපදවන භවාංගයට සමාන වූවකි. මිනිස් ලොව උත්පත්තියෙන් ම අන්ධ වූ ද, බිහිරි වූ ද, ගොළු වූ ද, නපුංසක වූ ද, තවත් එබඳු දුබල කම් ඇත්තා වූ ද පුද්ගලයන්ට ඇත්තේ හීන ඥානවිප්‍රයුක්ත කුශලයෙන් උපදවන අහේතුක භවංගය ය. එය තිරිසනුන්ගේ භවාංගයට වඩා මඳක් උසස් ය. උත්කෘෂ්ට ඥානවිප්‍රයුක්ත කුශලයෙන් හා හීන ඥානසම්ප්‍රයුක්ත කුශලයේන්ද මධ්‍යම ප්‍රමානයට ආලෝකවත් වූ ඥානවිප්‍රයුක්ත සහේතුක භවාංගයක් උපදවනු ලැබේ.

සාමාන්‍ය මනුෂ්‍යන්ගේ සන්තානයන්හි ඇත්තේ ඒ ඥානවිප්‍රයුක්ත භවාංගය ය. උත්කෘෂ්ට ඥානසම්ප්‍රයුක්ත කුශලයෙන් අතිශයින් පරිශුද්ධ වූ ඥානසම්ප්‍රයුක්ත භවාංගයක් උපදවනු ලැබේ. එය අභිධර්ම පොත්වල ත්‍රිහේතුක භවාංග නාමයෙන් හඳුන්වනු ලැබේ. ඒ ත්‍රිහේතුක භවාංගය අතිපරිශුද්ධ බැවින් ඉතා සියුම් වූ ද ගැඹුරු වූ ද කරුණු එහි සැපෙයි. එබැවින් ඒ භවාංගය ඇති සන්තානයෙහි ස්කන්ධ ධාත්වායතන ඉන්ද්‍රිය සත්‍ය ප්‍රතීත්‍යසමුත්පාදදි ධර්ම දැන ගන්නා වූ ද ධර්මයන්ගේ අතිත්‍යාදි ලක් ෂණ දැනගන්නා වූ ද සිත් වලට පහළ වීමට අවකාශ ලැබේ. එබැවින් ඔවුහු ම ධ්‍යාන මාර්ග ඵල ආදී උත්තරී මනුෂ්‍ය ධර්මයන් ලැබීමෙහි සමත් වෙති. සෙස්සෝ නො සමත් වෙති. ධ්‍යානාදිය ඒ ආත්මයේ දී ම ලැබීමට ත්‍රිහේතුක පුද්ගලයකු ම විය යුතුය යි කියනුයේ සුපරිශුද්ධ භවාංග සන්තානය තැතියවුනට ඒ ගැඹුරු ධර්ම සිතින් හසු කර ගත නො හෙන බැවිනි.

අපගේ සන්තානවල නිතර භවාංග චිත්තය ඇති වන නමුත් ඒ බව අපට නො දැනෙන්නේ එය ම මනෝද්වාරය [illegible] බැවිනි. එය ඇසට අනෙකක් පෙනෙනවා මිස ඒ ඇස ම නො පෙනීම මෙන් තේරුම් ගත යුතුය. ඇති නැති බව දැන ගැනීම [illegible] පරම දුෂ්කර වූ මේ භවාංග චිත්තය අති ගම්භීර ධර්මයකි.




5 වන පිටුවෙන් ......

## වැල්ලවත්ත ශ්‍රී විජයාරාමය ධර්මශාලාව ප්‍රතිසාංස්කරණය කිරීම සඳහා ආධාර කළ පිංවතුන් ඉතිරි කොටස..

**රු. 450 ක් ආධාර කල පිංවතුන්**

එස්.ආර්.එච්. රණවීර මිය, ශ්‍යාමලී පෙරේරා මිය, එච්.පී. අනුලාවතී මිය, අයි.ඒ.එස්. ඉඹුලාන මිය, අනෝමා ලියනගේ මිය, ඉරෝෂා ප්‍රනාන්දු මිය, යූ.ඩී.කේ. පද්මිණී මිය, කේ.පී.එන්.පී. පුෂ්පලතා මෙය, කේ.පී.ඩබ්.ජේ. පුෂ්පලතා මෙය, චන්ද්‍රා බාලසූරිය මිය, පී.එම්. සේනාධීර මයා, මහේන්ද්‍ර ද සිල්වා මයා, පී.එම්. පියදස මයා, එස්.ආර්. මුණසිංහ මයා, එස්. ආර්. මුණසිංහ මයා, එම්. සුජීවා නන්ද මෙහෙණින් වහන්සේ, ආරියනන්ද මෙහෙණින් වහන්සේ, එස්.ඩී.ආර්. නෝනිස් මයා, සෝමරත්න අබේගුණවර්ධන මයා, ඒ. ගුණදාස මයා, එස්.ඒ.ඩී.එම්. පෙරේරා මිය, මානෙල් කුමාරතිලක මිය, එන්.ඒ.එස්. වක්කුඹුර මයා, ඩී.එන්. දසනායක මිය, ආර්.ඒ.පී.පී. රාජපක්ෂ මිය, ආර්.එස්. නන්දන මයා, එල්. ආර්. වාසල මිය, සුජිතා ජයවර්ධන මිය, කේ.කේ.පී. රණවීර මයා, ශාන්ති අමරසිංහ මිය, ශ්‍රීමතී සහබන්දු මිය, රොමේෂ් ද කොස්තා ජයවර්ධන මයා, ඩබ්.ඩී.

## අපගේ ආශිර්වාදය හා පුණ්‍යානුමෝදනාව

- කඳුබොඩ ජාත්‍යන්තර විපස්සනා භාවනා මධ්‍යස්ථානයේ අභිනව ධර්ම ශාලාවට විදුලිපංකා
- 20 ක් පූජා කිරීමට දායක වු සියළු දෙනාට හා ඔවුන්ගේ පවුල් වල සියළු දෙනාටත් ඔවුන්ගේ සියළුම මළගිය ඥාතීන් වෙත.
- 2009.05.23 කඳුබොඩ ජාත්‍යන්තර විපස්සනා භාවනා මධ්‍යස්ථානයේ පැවති අපගේ ත්‍රෛමාසික දාන ශීල භාවනා වැඩසටහනට උදේ සවස ගිලන්පස පූජා කිරීම වෙනුවෙන් අප සාමාජික සාමාජිකාවන් වන පී.සූරිය ආරච්චි මහතා, ආර්.ඩබ්ලිව් ගුණරත්න මහතා, එස්.පී පියරත්න මහතා, අමිතා හෙට්ටිආරච්චි මහත්මිය, රමණී පෙරේරා මහත්මිය හා රේණුකා විදානාරච්චි යන මහත්ම මහත්මීන්ගේ පවුල්වල සියළු දෙනාටත් ඔවුන්ගේ සියළුම මළගිය ඥාතීන් වෙත.
- මෙත් සවිය සඳහා විශේෂ ආධාරයක් වශයෙන් රු 10,000/- ක් පරිත්‍යාග කළ අප සාමාජික ජේ. කරදවල මහතාට හා පවුලේ සියළු දෙනාටත් ඔවුන්ගේ සියළුම මළගිය ඥාතීන් වෙත. (මෙම ආධාර මුදල උතුරේ අවතැන් වුවන්ට සනීපාරක්ෂක තුවා සැපයීම සඳහා යොදවන ලදී)
- මෙත් සවිය සඳහා විශේෂ ආධාරයක් වශයෙන් රු 79,500/- ක් පරිත්‍යාග කළ අප සාමාජික එන්.එච් ජයවීර මහතාට හා පවුලේ සියළු දෙනාටත් ඔවුන්ගේ සියළුම මළගිය ඥාතීන් වෙත.

- මෙත්සවිය දහතුන්වන කලාපය වන මෙම සගරාව මුද්‍රනය කිරීම සඳහා යන බරපැන පියවීම සඳහා රු.50,000/- ක මුදලක් පරිත්‍යගකර ධර්ම දනමය පුණ්‍යයකර්මයක් සඳහා දයකවූ සමන්ති අනුබුදු මැතිණියගේ සියළු කටයුතු සාර්ථක වේවායි මෙත් සිත් පෙරදැරිව අශිර්වාද කරමු.



*කෲරත්වයෙන් තොර දැහැමි සමාජයක් ගොඩනගමු!*

# 2550 බුද්ධ ජයන්තිය සැමරීම වෙනුවෙන් මෙත්සවිය 2006 වර්ෂයේ වෙසක් පෝද ඇරඹූ සත්ව හින්සණය පිටුදකිමු වැඩසටහන මල්ඵල ගැන්වෙන වගයි...

සත්වහිංසනය පිටු දකින නිති සකසන ලෙස අතිගරු ජනාධිපතිතුමා වෙත භාරදුන් අත්සන් ලක්ෂයකින් යුතු ආයාචනය හා "සත්ව ඝාතනය වළකමු" CD තැටි 2550ක් නොමිළයේ බේදහැරීමෙන් ඇරඹූ ඉහත වැඩසටහන තව දුරටත් ක්‍රියාත්මක වී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස නීති කිහිපයක් සංසෝධනය වී ඇති අතර ( 1907 සිට තිබූ රු. 100/- දඩය හා තෙමසක සිර දඩුවම 2009 වසරේ සිට රු.50,000 දඩයක් හා වසර 3ක සිර ඥඩුවමක් දක්වා දීර්ඝ කර සංසෝධනය කර ඇත) තවත් නීති සැකසෙමින් පවතී.

මේවන විට සත්ව හිංසනය පිටුදකින මෙත්සවිය ඇතුලු ලංකාද්විපයතුල ක්‍රියාත්මක වන සමිගම් 11ක එකතුවකින් සැදුම්ලත් සමස්ථ ලංකා අවිහිංසා ඒකාබද්ධ මහා සම්මේලනය පිහිටුවා ඇත.( එකාබද්ධිත සංගම් :- මෙත්සවිය, අනගාරික ධර්මපාල චින්තන පදනම, අවිහිංසා මෛත්‍රි සංගමය, ගැල්ගව මිතුරෝ, පතිරණ මෙහෙයුම් පදනම, මෛත්‍රි අහිංසා සංගමය, ශ්‍රී ලංකා අමද්‍යප මහාසභාව, ශ්‍රී ලංකා අවිහිංසාවාදී මහා සංගමය පූජා උත්තමපූජා, ශ්‍රී ලංකා නිර්මාංසාහාර සමිතිය සහ සත්ත්ව සුභ සාධක භාරය.) සංස්කෘතික කටයුතු හා ජාතික උරුමයන් පිළිබද ආමාත්‍යාණ්ශයේ අනුග්‍රහයෙන් 2006.08.20 දින පිහිටවූ මෙම සම්මේලනයේ අනුසාශක ධුරයන් අතිපූජ්‍ය අහංගම අනන්ද ස්වාමීන් වහන්සේ සහ අතිපූජ්‍ය හාරිස්පත්තුවේ අරියවංශාලන්කාර ස්වාමීන් වහන්සේ විසින් දරනු ලබන අතර ගරු සභාපති ධුරය හොබවන්නේද අප මෙත්සවිය නිර්මාතෘ ආචර්ය චන්දන ජයරත්න මහතා විසිනි.

## සමස්ථ ලංකා අවිහිංසා ඒකාබද්ධ මහා සම්මේලනය මගින් කාරුණික හදවත් ඇති පුණ්‍යවන්ත ඔබට කෙරෙන කාරුණික ආරාධනයයි.

මරණයට කැපවූ ගවයකු හෝ දෙදෙනෙකු බේරා ගැනීමට විශාල මුදලක් වියදම් කරනවාට වඩා ගවයින් දහස් ගනනකගේ ජිවිත ඔබ ශ්‍රම දයකත්වයෙන් මරණයෙන් බේරා ගැනීමට උතුම් අවස්ථාවක්

## පොලිස් වසම් තුළ තාවකාලික ගව සුරුකුම් මධ්‍යස්ථාන ඇතිකිරීම


දැනට පවතින නීති අනුව මී ගවයින්,එළදෙනුන්,පැටවුන් හා කෘෂිකර්මාන්ත කටයුතු වලට යොදගත හැකි පිරිමි සතුන් සහ අවුරුදු 12 අඩු ගවයින් ඝාතනය කිරීම සපුරා තහනම් උවත් මෙවැනි ගවයින් දහස් ගනණින් නීති විරෝධිව මේ ධර්මද්විපය තුල ඝාතනය කෙරේ.

නීති විරෝධිව ඝාතනය කිරීම සදහා කෲරවධහිංසා වලට ලක්කරමින් ප්‍රවාහනය කරනු ලබන ගවයින් නීතියේ රැහැනට හසුකරගැනීමේ ප්‍රධාන බාදකය වී ඇත්තේ පොලිසිය මගින් එම ගවයින් අල්ලා ගත් පසු නඩු කටයුතු අවසාන වන තෙක් ඔවුනට ආහාර පාන දී රැකබලා ගෙන රදවාගැනීමට ස්ථාන නොමැතිවීමයි. එම නිසා පවතින නීතීය ක්‍රියාත්මක කිරීමට පොලිසියට අපහසු වී ඇත. මේ සදහා දිවයිනේ සෑම පොලිස් වසමකම තාවකාලික ගව සුරැකුම් මධ්‍යස්ථාන ඇතිකිරීමට කටයුතු සම්පාදනය කරමින් සිටින බැවින් ඒ සදහා පුණ්‍යවන්ත වූ ඔබගේ උපකාරය අපේක්ෂා කෙරේ.

එබැවින් මෙසේ ජිවිත අහිමිවන අහිංසක ගවයින්ට නඩු කටයුතු අවසන් වනතෙක් රැකවරණය ලබාදීමට කැමති පිංවත් ඔබ මෙත්සවියට හෝ පහත ලිපිනයට අයදුම්පත් යොමුකරන්න.



සමස්ථ ලංකා අවිහිංසා ඒකාබද්ධ මහා සම්මේලනය
ශ්‍රී ලංකා විදර්ශනා භාවනා මධ්‍යස්ථානය,
අංක.108, විජේරාම මාවත,කොළඹ 7.



වැඩිවිස්තර සඳහා 2009-08-05 පොහෝද බුදුසරණ පුවත්පත් දැන්වීම බලන්න.
නැතහොත් පහත දුරකථන අංකයන්ගෙන් විමසන්න.
ආචාර්ය චන්දන ජයරත්ත (ගරු සභාපති )0714800800
(දුරකථන ඇමතුම් දහවල් 12-1 අතර හා රත්‍රි 9-10 අතර පමණි)
යු.ඩි.අදිකාරම් (ගරු සම ලේකම්) 0714220310
ජ්‍යේෂ්ඨ පොලිස් අධිකාරි රංජිත් ගුණසේකර මයා (පොලිස් නිල මාධ්‍ය ප්‍රකාශක) 0715332555
නිහාල් විජේරත්න (ජාතික සංවිධායක) 0714809262

මීට අමතර ව මෙම වැඩසටහනට ලියා පදිංචි වන පිංවතුන් හට දෙවනුව අවශ්‍යනම් පමණක් උසාවි මගින් රාජසන්තක කරනු ලබන ගවයින් ස්වේච්ජාවෙන් කැමති ප්‍රාමාණයක් තමන්ට ම තබාගැනිමට අවස්ථව ද ලබාදිය හැක.

# ත්‍රෛමාසික දන- සීල භාවනා වැඩසටහන - කඳුබොඩ විපස්සනා භාවනා මධ්‍යස්ථානය 2009-05-03





කඳුබොඩ විපස්සනා භාවනා මධ්‍යස්ථානයේ නායක ස්වාමීන්වහන්සේ





කඳුබොඩ විපස්සනා භාවනා මධ්‍යස්ථානයේ දියසේනපුර විමල ස්වාමීන්වහන්සේ






කඳුබොඩ විපස්සනා භාවනා මධ්‍යස්ථානයේ ධර්ම ශාලාව සඳහා විදුලිපංකා 20ක් පූජා කිරීම.









කඳුබොඩ විපස්සනා භාවනා මධ්‍යස්ථානයයේ නිර්මාතෘ මාර්ග ඵල ලාභි ස්වාමීන්වහන්සේ නමක් ලෙස ප්‍රකට අපවත්වී වදළ අති පූජ්‍ය කහටපිටියේ සුමතිපාල නායක ස්වාමීන්වහන්සේගේ අනුරුවක්.

# For a happy and less troublesome life...

**ONE**. Give people more than they expect and do it cheerfully.

**TWO**. Don't let a little dispute injure a great friendship.

**THREE**. Don't believe all you hear, spend all you have or sleep all you want.

**FOUR**. Smile when picking up the phone. The caller will hear it in your voice

**FIVE**. When you say, 'I'm sorry,' look the person in the eye.

**SIX**. Be engaged at least six months before you get married.

**SEVEN**. Marry a man/woman you love to talk to. As you get older, their conversational skills will be as important as any other.

**EIGHT**. Never laugh at anyone's dreams. People who don't have dreams don't have much.

**NINE**. When you realize you've made a mistake, take immediate steps to correct it.

**TEN**.. In disagreements, fight fairly. No name calling.

**ELEVEN**. Don't judge people by their relatives.

**TWELVE**. Talk slowly but think quickly.

**THIRTEEN**! .. When someone asks you a question you don't want to answer, smile and ask, 'Why do you want to know?'

**FOURTEEN**. Remember that great love and great achievements involve great risk.

**FIFTEEN**. Say 'bless you' when you hear someone sneeze.

**SIXTEEN**. When you lose, don't lose the lesson.

**SEVENTEEN**. Remember the three R's: Respect for self; Respect for others; and Responsibility for all your actions.

**EIGHTEEN.**
Spend some time alone.

## To achieve your Goals

If you want to live a dream life, not only must you decide what you want, turn your dream into measurable goals, break those goals down into specific action steps, and visualize and affirm your desired outcomes -- you must start taking action! I recommend making the commitment to do something every day in at least three different areas of your life that moves you in the direction of your goal. If one of your goals is physical fitness, make a commitment to do some sort of exercise -- aerobics, weight training, stretching -- four to five times a week for a minimum of twenty minutes. I read recently that if you simply go for a 30 minute walk four times a week, that would put you in the top 1% of those people getting physical exercise! If your goal is financial independence, start saving and investing a portion of your income every month with no exceptions. If your goal is to write a book, write for a minimum of one hour every day.

- Jack Canfield

# කර්ම විපාක

## ස්වර්ණ තිලකා කුමරිය සැඩොල් කුලයක ඉපදීමට හේතුව

මෙතුමිය දිනක් මව සමග ලංකාවේ අභයගිරි චෛත්‍ය වැඳීමට ගොස් මල් අසුන අපිරිසිදු බැවින් එය පිරිසුදු කිරීමට පැන් ගෙන ඒමට ගිය අතර මෙතුමිය ඒ අපිරිසිදු මල් අසුනේම මල් ආසනයේ, නමුදු සිත පහදවා ගෙනා සියළු මල් පුද දුටු දුටු පුරුෂයන් වසග කරවන රූප සම්පත් පැතුවාය.මව්තුමිය පැන් ගෙනවිත් බලන කල අපිරිසිදු මල් අසුනේම මල් පුද ඇති බව දැක තම දුවට සැඩොල් කෙල්ල යැයි කියා කළ චරදට දෙස් නැගීය. ඇය ද තම මවට කිපී චණ්ඩාල කෙල්ල නම් ඔබමයි කියා කීවාය. පසු කළෙක මෙ දුව දඹදිව මධුරා නුවර වීණා වාදනය කරන සැඩොල් කුලයක උපන් අතර දුටු දුටු පුරුෂයන් වසග කරන රූප සම්පත්තියක් ද ලැබුවාය.

ඇය ලබාගන්නට නොහැකි වූ රජ දරුවන් පස් දෙනෙක් සිය දිවි නසා ගත්හ. අවසානයේ ඇයට ද රූප සම්පත්තිය නිසාම මැරෙන්නට වූවාය. එබැවින් තම මව්පියන්ට නොබැණිය යුතු අතර කරන පැතුම් ද මෙලෙස තමන්ටත් අනුන්ටත් දුක් දෙන පැතුම් නොවිය යුතුය.

(සද්ධර්මාලංකාරය 363 පිට)

## කැලණි තෙරුන් වහන්සේ කකියන තෙල් කටාරමකට දමා මරන්න හේතුව

මේ තෙරුන් වහන්සේ කැළණි වෙහෙරෙහි විසූ අතර කැළණි තිස්ස රජුගේ බිසව හා උත්තිය නම් යුව රජ අතර නොමනා සම්බන්ධයක් තිබිණි. මෙය දැනගත් රජු ඔහු මරන්න සොයද්දී ඔහු පැනගොස් සැඟවී සිට තරුණයෙකු හිතවත් කරගෙන ඔහුට සිවුරු පොරවා රජ දේවියට හසුන් පතක් දෙන්න යැයි ද එවන ලදී. මේ හොර පැවිද්ද කැළණි තෙරුන් වඩද්දි පසුපස ගොස් දන් වළඳ එන ගමන් දේවියට ගන්න පෙනෙන සේ ඒ පොඩිනම අත බිසවට දෙන ලද්දක් යැයි සිතා තෙරුන් තෙල් කටාරමේ ලා ගිනිගසා මරවන්න නියෝග කළේය.

තෙරුන් වහන්සේ රහත් බැවින් එහි බුද්ධ පරියංකයෙන් සිට මෙසේ වීමට හේතු වූ අකුසලය බැලූ සේක. තෙරුන් එක ආත්මයක ගොපළු දරුවෙකුට සිටියදී කිරි උණුකරන විට මැස්සකු අල්ලා දමා කකාරා මැරූ අකුසලය දැක මෙය නැවත්විය නොහැකි කර්මයකැයි දැන එහිම පිරිනිවුන සේක. පසුව දෙවියන් කිපි මුහුද ගොඩ ගලා රජුගේ දුව බිළි දී ඇය විහාර මහා දේවිය යැයි රුහුණට ගොඩ බැස්සාය. පින්වතුනි මැස්සකු මැරු කර්මය මෙතරම් බරපතල නම් වෙන සතකු මැරුවොත් කොහොම විපාක දේ දැයි සිතිය යුතුය.

(සද්ධර්මාලංකාරය 446 පිට)

## සාලිය කුමරුගේ ආදරවන්තිය අශෝකමාලා සැඩොල් කුලයක ඉපදුනේ ඇයි ?

දුටුගැමුණු රජුගේ පුත් සාලිය කුමරු නිතරම දනමය පුණ්‍යකර්ම කිරීමට සිත නැමුණු කෙනෙකි. නමුදු විවාහ කරගත්තේ අතිශයින්ම ප්‍රියකරු රූ සපුවකින් යුත් සූ සැටක් ස්ත්‍රී ලක්ෂණයන්ගෙන් හෙබී අශෝකමාලා නම් සැඩොල් කුමරියක් වේ. සාලිය කුමරු ඇයට බැඳී පෙම නිසා රජ සැප ද අත්හැරියේය. මතු මෛත්‍රී බුදු සසුනේ මෛත්‍රී බෝසතුන්ගේ බ්‍රහ්ම වර්ධන නම් එකම පුත්‍රයා වී ඉපදෙන්නේ ද මේ සාලිය කුමරුය. මෙතුමාගේ බිරිඳ සැඩොල් කුලයක ඉපදීමට හේතුව නම් ඇය පෙර මේ ලක්දිව සුමනා නමින් ඉපිද තරුණියකව සිටියදී දිනක් ඉඳුල් ඉහිරවා ආහාර ගෙන ඇති බව දුටු ඇගේ මව්තුමිය ඇයට සැඩොල් කෙල්ල තෝ කුමක් නිසා මේ අපිරිසිදු කරන්නේ දැයි දෙස් නැගීය. එහිදී සුමනාවෝ මව කෙරෙහි කිපී චණ්ඩාල කෙල්ල නම් මා නොව මෑණියන්ම යැයි කීවාය. මෙහි විපාක වශයෙන් ඇය මේ ජීවිතයේ සැඩොල් කුලයක ඉපදුන බව ධර්මයේ දක්වා ඇත.

(සද්ධර්මාලංකාරය 549 පිට)

## දුසක හිමි දසියකගේ කුස ඉපදීමට හේතුව


මේ ස්වාමින් වහන්සේ අනේපිඩු සිටුතුමාගේ ගෙදර බැලමෙහෙවර කරන දසියගේ කුස ඉපදීමට හේතුව මෙසේය. පෙර මෙතුමා කාශ්‍යප බුදු සසුනේ එක් මහරහතන් වහන්සේ නමකට උපස්ථාන කළ අතර දිනක් යම්කිසි සුළු වැඩක් තෙරුන් ලවා කෙරෙව්වේය. (ස්වාමිනි ඔතන තියෙන පොත අරන් දෙන්න කියා කියන්නා වගේ) ඒ කරගත් අකුසල කර්ම බලයෙන් අප බුදු සසුන කාලයේ දසියක කුස උපන් බව දක්වා ඇත. එබැවින් පැවිද්දන් භජනය කිරීම බෙහෝම පරිස්සමෙන් කළයුතු වැඩක් බව දතයුතු.

(පරමත්ථ දීපනි නම් ථේර ගාථට්ඨකතා 69 පිට)

## කාසියගේ විශිෂ්ඨ රූප සම්පත් ලැබීමට හා ගණිකාවක් වීමට හේතුව

මෙතුමිය රජගහ නුවර අබිරූපන කාන්තාවක් වූවාය. ඇයගේ විශිෂ්ඨ රූප ශෝභාව නිසාම ඇය සියළු රජ දරුවන්ට පරිභෝගයට ගැනීමට ගණිකාවක් කොට තබන ලදී. ඇය මෙසේ බෙහෙවින්ම පරාධීන වූ ජීවිත වෘතියක නියැලීමට හේතුව මෙසේ දත යුතු. මෙතුමිය පෙර කාශ්‍යප බුදු සසුණේ පැවිදිව මනාව බඹසර ආරක්ෂා කළ අතර එක් දිනක් රහත් භික්ෂුණියකට ගණිකාව යැයි ආක්‍රෝෂ කළ පවින් නිරයෙහි පැසී පසුව මෙකල මෙසේ පරාධීන පහත් ජීවිතයක් ලැබුවාය. කාශ්‍යප සසුනේ බඹසර රැකි පිනෙන් විශිෂ්ඨ රූප සම්පත් ලැබුවාය. දුතේත උපසම්පදව ලැබුවේද මෙතුමිය වේ. පසුව සසුනේ පැවිදිව රහත් වූවාය.

(අපදාන පාලියේ අඩ්ඪකාසි ථේරී අපදානය)



# මෙත් සවිය මෛත්‍රී සංසදය සාමාජික අයදුම්පත

**(ජායා පිටපත්ද භාරගනු ලැබේ. මෙම සියලු තොරතුරු සම්පූර්ණයෙන් රහසිගතව තබා ගනු ලැබේ.)**

1. සම්පූර්ණ නම ..........................................................................................

2. ස්ත්‍රි / පුරුෂ භාවය................ 3. ජාතික හැඳුනුම්පත් අංකය..............................................

(ඡායා පිටපතක් අමුණන්න)

4. උපන් දිනය...................... 5. වයස................. 6. ආගම..........................................

7. ස්ථිර ලිපිනය..........................................................................................

..........................විද්‍යුත් තැපැල(e-mail)....................................... දුරකථන අංකය..........................................

8. දිස්ත්‍රික්කය...................... 9. විවාහක / අවිවාහක බව............................................

10.රැකියාවක් කරන්නේ නම් ඒ පිළිබඳ විස්තර..............................................................

(ඉංග්‍රිසියෙන් ද සඳහන් කරන්නේ නම් මැනවි) ....................................................................

11. කාර්යාලීය ලිපිනය හා දුරකථන විස්තර..............................................................

12. ලිපි එවිය යුතු ලිපිනය..........................................................................

13. ලබා ඇති ඉහලම අධ්‍යාපනික සුදුසුකම්

1.............................................................................

2.............................................................................

14. වෙනත් සංගම් ආදියෙහි සාමාජිකත්වය දරන්නේ නම් ඒ පිළිබඳ විස්තර

1 ............................................................................

2 ............................................................................

3 ............................................................................

15. ඔබ කිසියම් ශාරීරික රෝගයකින් (ඇඳුම,හෘද රෝග,දියවැඩියාව,රුධිර පීඩනය,අපස්මාරය ) පෙලෙන්නේ නම් ඒ පිළිබඳ විස්තර

..........................................................................................

16. ඔබ කිසියම් මානසික රෝගයක් සඳහා වෛද්‍ය ප්‍රතිකාර / බෙහෙත් ලබාගෙන තිබේද? ඔව්/නැත.

17. එවැනි මනසික රෝගයකින් පෙලෙන්නේ නම් ඒ පිළිබඳ විස්තර . .

..........................................................................................

18. ඔබ විසින් සඳහන් කළයුතු මෙහිදි වැදගත්යැයි හැගෙන වෙනත් විස්තර හෝ යෝජනා /අදහස් තිබේනම් මෙහි සඳහන් කරන්න ..........................................................................

..........................................................................................

මා දන්නා තරමින් ඉහත කරුණු සත්‍ය බවට ප්‍රකාශ කරමි. සාවද්‍ය තොරතුරු සැපයීම සාමාජිකත්වය අවලංගු කිරීමට හේතුවක් ලෙස මා පිළිගනිමි.

දිනය..................... අයදුම්කරුගේ අත්සන.................................

**කාර්යාලීය ප්‍රයෝජනය සඳහා**

සාමාජික අංකය..................................

තේරීම් කමිටුවේ තීරණය

.................................... ....................................

තේරීම් කමිටු සභාපති විධායක ලේකම්

දිනය.................

සැ.යු. ඔබ වෙනුවෙන් පවත්වන විවිධ දේශණ/වැඩමුළු/මනස දියුණු කිරීමේ වැඩසටහන් සංවිධානය කිරිම, දේශණ ශාලා ගාස්තු, ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ ගාස්තු, පුවත් පත් දැන්වීම්, මුද්‍රිත සටහන් සැපයිම, හැඳුනුම්පත් සැපයිම, තැපල් ගාස්තු, විදුලි ගාස්තු, කාර්යාලීය ගාස්තු හා පරිපාලන නිලධාරී මහතා වෙනුවෙන් කරනු ලබන මාසික ගෙවීම් ආදිය සඳහා යන බරපැන පියවා ගැනිම සඳහා රු.1500/-ක මුදල් සාමාජිකත්වය පිරිනැමුවාට පසුව එවිය යුතුය.(එය ඇතුළත්විමේ ගාස්තුව රු.500/-හා වසර දෙකක සාමාජික ගාස්තු රු. 500/-x2 වශයෙනි). මෙම බරපැන ගෙවීමට නොහැකි ඉතා අඩු ආදයම් ලබන පවුල්වල අය තම ආදයම් තහවුරුකළ හැකි ලිපි ලේඛන (උදා:- තම විහාරස්ථානයේ නායක ස්වාමින්වහන්සේගේ නිර්දේශය,) සහිත ග්‍රම නිලධාරීතුමා මගින් විධායක කමිටුව වෙත සාමාජික ගාස්තු ඉවත් කිරීම සඳහා කරනු ලබන ඉල්ලුම් සලකා බලනු ඇත. සාමාජික ගාස්තු ගෙවීම, ඔබ තෝරාගත්තාට පසුව කාර්යාලයට පැමිණ සිදු කළ යුතුය. (දිනය පසුව දැනුම් දෙනු ලැබේ.) කාර්යාලය සඳුද, අගහරුවාද හැර සතියේ ඉතිරි දින 5 තුල සෙනසුරාද, ඉරිද ද ඇතුලුව සතියේ දින 5ක් විවෘතව පවති. අයදුම් කරන සැමකෙනෙක්ම තෝරා නොගන්නා අතර එසේ තෝරා නොගැනිමට හේතුව දැනගැනිමට අවශ්‍ය නම් අයදුම්පත් විමර්ශනය සඳහා වන ඇතුලත්විමේ ගාස්තු ගෙවිය යුතු වන්නේය.

**නිසිපරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් ජාතික හැඳුනුම්පතේ ඡායාපිටපතක් සහ 4"x 9" ප්‍රමාණයෙන් යුතුව තම ලිපිනය ලියු ස්මුද්දරකවර 2 ක් සමග පහත සඳහන් ලිපිනයට තැපැල් මගින් පමණක් යොමු කරන්න. (අයදුම්පත සමග කිසිදු මුදලක් හෝ චෙක් පතක් නොඑවන ලෙස කරුණාවෙන් දැනුම්දෙනු ලැබේ) ලිපිනය-ගරු ලේකම්, මෙත්සවිය, ශ්‍රී විජයරාමය, පෙඩ්රිකා පාර, කොළඹ 6. දුරකථනය 011-2505088 0714-014467**

# නිවේදන සහ නොමිළයේ පලකරනු ලබන සාමාජිකයින්ගේ දැන්වීම්

## වැදගත්

❖ මෙත් සවිය පුවත් සඟරාවේ පළකිරීම සඳහා එවන සියලු ලිපි ද, දාන-ශිල-භාවනා වැඩසටහන් වලදී දායකත්වය දරන පිංවතුන්ද, අනෙකුත් පුණ්‍ය කටයුතු වලට අත හිත දෙන පිංවතුන්ද සඟරාවේ ප්‍රකාශනයට පත් කළ යුතු විස්තර A4 ප්‍රමාණයේ කොළවල පමණක් ලියා භාරදිය යුතුය. සාමාජිකයින්ගේ දැන්වීම් නොමිළයේ පලකරනු ලැබේ. කොළ කැබැලි හා තුන්ඩුවල ලියා එවන විස්තර අස්ථාන ගත විය හැකි බැවින් ඒ පිළිබඳ වගකියනු නොලැබේ.

❖ සාමාජික සාමාජිකාවන් විසින් එවන සෑම ලිපියකම හා ලිපිය එවන කවරයේ ද වම්පස උඩ කෙළවරෙහි තම සාමාජික අංකය පැහැදිලිව ලියා තිබිය යුතුය. ඔබගේ ලිපිනය ලියාදීම සඳහා භාවනා වැඩසටහන් වලදී අප විසින් ලබාදෙන ලිපි ඈවරවලද අංකය සඳහන් නොකරන හා වැරදි අංක සඳහන්කරන සාමාජිකයින් බොහෝ දෙනෙකු හමුවී ඇත. මේ අය සඳහා පුවත් සඟරාව තැපෑලෙන් නොලැබීයාම පිළිබඳව වග කියනු නොලැබේ.

**- සංස්කාරක -**

## මෙත්සවිය දුරකථන අංක

**මෙත්සවිය තොරතුරු විමර්ශනය කරනවිට පරිපාලන නිලධාරි මහතා** අමතන්න (011-2505088, 0714-014467). එම දුරකථන වල බිල්පත් ගෙවනු ලබන්නේ මෙත් සවිය මෛත්‍රී සංසදය විසිනි. අපගේ වෙබ් අඩවිය වන www.methsawiya.org මගින්ද තොරතුරු ලබා ගත හැකිය.

**මීට අමතරව සමලේකම් වරුන් වන තුසිත දොඹගොඩ (071-4454411) හා බී. ඩබ්. චමින්ද (077 7790076 )**යන මහතුන් ගේ පුද්ගලික දුරකථන අංකයන් අමතා ද හදිසි තොරතුරු ලබා ගත හැකිය.

**සංසදයේ සභාපති ආචාර්ය චන්දන ජයරත්න මහතා ඇමතීම පුද්ගලික දුරකථන අංක (0714 800800 හෝ 0777 309385)** මගින් දහවල් 12.00-1.00 ත් අතර හෝ රාත්‍රී 9.00 - 10.00 ත් අතර පමණක් (ඉතා හදිසි අවශ්‍යතාවයකදී ඕනෑම වේලාවක) සිදුකරන්න. (දිනකට දුරකථන පණිවිඩ 30 ක් පමණ ලැබෙන නිසා සාමාජික අංකය හා නම පවසා සංක්ෂිප්ත ලෙස ඔබගේ විමසීම් සිදුකරන්නේ නම් මැනවි.)

## කොළඹ ජාතික රෝහලේ වාට්ටු සඳහා බුදු පිළිම සහ අසරණ රෝගීන් සඳහා අවශ්‍ය මූලික ද්‍රව්‍ය පරිත්‍යාග කිරීම

වැල්ලවත්තේ ශ්‍රී විජයාරාමාධිපති අහංගම ආනන්ද ස්වාමීන්වහන්සේගේ අනුසාසනා පරිදි පැවැත්වෙන ඉහත සත්කාර්ය සඳහා බුදු පිළිම, සුදු රෙදි, සැත්කම් වලදී අන්දවන ඇඳුම්, දත් බුරුසු හා දන්තාලේපන, තුවා, සුදු හෝ පාට සරම්, ඇඳ පෝච්චි ඇතුළු අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය පරිත්‍යාග කිරීමට කැමති පින්වතුන් එම ද්‍රව්‍ය ගරු ස්වාමීන්වහන්සේට හෝ කාර්යාලයට පැමිණ භාරදෙන්න.

## ප්‍රායෝගික අධිමානසික විද්‍යාව හා පංච අභිඥා පිළිබඳව දැනුවත් කිරීමේ 15 වන වැඩසටහන

2009.09.27 දින පෙ.ව. 10.00 ට අරඹනු ලබන අතර ඒ සඳහා අයදුම්පත් 2009.08.23 දිනට පෙර භාර ගනු ලැබේ.

**ඉඩකඩ සීමිත බැවින් පළමුව ලියාපදිංචි වන අය සඳහා මූලිකත්වය ලබා දේ**

## නොමිළයේ රෝද පුටු සහ කිහිලි කරු ලබා දීම.

මෙත් සවිය මගින් අසරණ අය සඳහා රෝද පුටු සහ කිහිලි කරු පරිත්‍යාග කිරිමේ වැඩපිළිවෙලක් දියත් කර ඇත. රෝද පුටු හෝ කිහිලි කරු අවශ්‍ය අය වෙත්නම් මෙත් සවිය වෙත ලිඛිතව ඉල්ලීමක් සිදු කල යුතුය. මෙම වැඩසටහන සඳහා රෝද පුටු සහ කිහිළි කරු ලබා දී දායක වීමට කැමති පින්වතුන් හට එම උපකරණ මෙත් සවිය වෙත ලැබෙන්නට සලස්වන ලෙස මෙත් සිත් පෙරදැරිව ඉල්ලා සිටිමු.


## සයිට් "එන්" ස්ටයිල් ඔප්ටොමෙට්‍රිස්ට්ස්

**SIGHT-N~ STYLE OPTOMETRISTS**

නො: 126ඩී, හයිලෙවල් පාර, නුගේගොඩ.
(අනුලා විදුහල ඉදිරිපිට)
දුරකථනඃ 2854758)
(සියලුම වර්ගයේ ඇස් කණ්නාඩි අවශ්‍යතා සඳහා විමසන්න)
මෙ.ස.සාමාජිකා නෙරංජලා කන්නන්ගර මහත්මිය


## සංසදයේ ලිපි කටයුතු සඳහා මුද්දර පරිත්‍යාග

සංසදයේ ලිපි ගනුදෙනු කටයුතු සඳහා මුද්දර ගාස්තුව ලෙස විශාල මුදලක් වැයකිරීමට සිදුවී ඇති අතර, මෙම සද්කාරය සඳහා මුද්දර පරිත්‍යාග කිරීමට කැමති පිංවතුන් හට රු.5/=මුද්දර කැමති ප්‍රමාණයක් පරිත්‍යාග කල හැකිය. ලබා දෙන මුද්දර ප්‍රමාණය ඒ සඳහා ඇති ලේඛනයේ සටහන් කරනු ලැබේ. මුද්දර 10 ට වැඩි ඕනෑම ප්‍රමාණයක් පරිත්‍යාග කරන විට සටහන් පොතට ඇතුල් කරනු ලැබේ. මෙත්සවිය සංසදයේ පැවැත්මට හා එහි වර්ධනය සඳහා ඔබගේ ශාසනායැති දයකත්වය අගය කරන්නෙමු.

## පුස්තකාල පොත් හා CD තැටි

ඔබ විසින් ලබාගෙන ඇති මාසයක් ඉක්මවූ පොත් හා CD තැටි කරුණාකර කාර්යාලය වෙත භාර දෙන්න. පුස්තකාල පොත් හා CD තැටි සඳුද අගහරුවාදා හැර කාර්යාලය විවෘතව ඇති සතියේ අන් දින වලදී සාමාජික ඔබහට ලබාගත හැක. පන්ති පැවැත්වෙන ඉරිද දින වලදී පමණක් පුස්තකාල පොත් ලබා ගැනීම සඳහා ප.ව 1.45 ට පෙර පැමිණෙන ලෙස කාරුණිකව දන්වා සිටිමු.

## ❋ සුව සෙත ❋

ප්‍රාණ/විශ්ව ශක්ති ක්‍රම මගින් සමහර රෝග සඳහා සිත දියුණු කරගත් අය මගින් රෝග සුව කිරීමේ නොමිළයේ පැවැත්වෙන වැඩසටහන් ඉරු දින වලදී ශ්‍රී විජයාරාමයේ දී ප.ව.12.00-2.00 දක්වා පැවැත්වේ. කාර්යාලයෙන් විමසා පැමිණෙන්න.

## අසරණ සරණ සහ මරණයට කැප වූ සතුන් නිදහස් කිරීම සඳහා පිංකැටවල එකතු කල මුදල්

සතුන් නිදහස් කිරීම සඳහා පිං කැටවල එකතු කල මුදල් භාර දීමට කැමති අය මෙත් සවිය කාර්යාලයට එම මුදල් භාර දී පිං පත්‍රිකාවක් ලබා ගන්න.

# පිංපොතෙන් බිඳක් .........





මෙත්සවියේ තවත් පුණ්‍ය කටයුත්තක් වන වැල්ලවත්ත ශ්‍රී විජයාරාමයේ
ඉපැරණි ධර්ම ශාලාව ප්‍රතිසංස්කරණය කිරීමෙන් අනතුරුව දිස්වන අයුරු. - 2009-04-08



ප්‍රතිසංස්කරණ කටයුතු
පිළිබඳ සාකච්චාවක




ශ්‍රී විජයාරාමයේ ධර්ම ශාලාව ප්‍රතිසංස්කරණයට මෙත්සවිය සාමාජික සාමජිකාවන්
ගේ පුණ්‍යාධාර පූජ්‍ය අහංගම ආනන්ද හිමියන්ට ලබාදුන් අවස්ථාවන්.

මෙත්සවිය සදහම් චාරිකාව - අනුරාධපුරය 2008-12-26






අනුරාධපුරය ජය ශ්‍රී මහා බෝධින් වහන්සේට උදෑසන කිරි ආහාර පූජාව සිදුකිරීම






මිරිසවැටිය සලපතල මළුව ප්‍රතිසංස්කරන කටයුතු අධීක්ෂණය කිරීමෙන් අනතුරුව, මාර්ග උපදේශක වරයකුගේ සහය
ලබාගනිමින් අටමස්ථානය වන්දනා කිරීම.

# මෙත් සවිය පස්වන මහා සමුළුව දින පැවැත්වූ
## මෛත්‍රී භූෂණ උපහාර ප්‍රදානෝත්සවය

**2009.01.04 ඉරුදින ප.ව. 2.30 ට බොරැල්ල - ධර්ම ගවේෂී බෞද්ධාශ්‍රම ශාලාවේදී පැවැත්වුණි.**





උපහාර උළෙල සඳහා මහා සංඝරත්නය වැඩම කරවීම අති පූජ්‍ය අමරපුර මහා නිකායේ මහානායක ධුරන්ධර රාජකීය පන්ඩිත වැලිගම ශ්‍රී ඤාණරතන මහානායක ස්වාමින්වහන්සේ, අති පූජ්‍ය අභංගම ආනන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේ, අති පූජ්‍ය හාරිස්පත්තුවේ අරියවංසාලංකාර ස්වාමීන්ද්‍රයන් වහන්සේ, අති පූජ්‍ය අතුරලියේ රතන ස්වාමීන්ද්‍රයන් වහන්සේ, අති පූජ්‍ය අගලකඩ සිරිසුමන ස්වාමීන්ද්‍රයන් වහන්සේ.









මොත්සිත් පෙරදැරි ජාතික මෙහෙවර, විශිෂ්ඨ සේවය හා ප්‍රවීනතාවය උදෙසා පිරිනැමෙන උපහාර සම්මානයන්ගෙන් කලාසූරි අරිසෙන් අහුබුදු සූරිනට හා අයිරාංගනී ද සිල්වා මැතිණියට ප්‍රාධානය කරන වගයි.





මෙත්සවිය සභාපති ආචාර්ය චන්දන ජයරත්න මැතිතුමා විසින් පිළිගැනීමේ කථාව පැවැත්වීම හා ධර්ම ගවේෂී බෞද්ධාශ්‍රම විහාරාධිපති ස්වාමීන් වහන්සේ, අරිසෙන් අහුබුදු ශූරීන් සහ අයිරාංගනී ද සිල්වා මැතිණිය සමුළුව ඇමතීම.